# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 13,230 — 1962 ජූලි 27 වැනි සිකුරාද — 1962.7.27

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

## III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් :— | | | |
| ප්‍රාරම්භක දැන්වීම් | ... | ... | — |
| අවසාන නියෝග | ... | ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරුන් විසින් ඉඩම් විකිණීම :— | | | |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |

| | | | පිට |
|---|---|---|---|
| ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීන් විසින් ඉඩම් විකිණීම:— | | | — |
| බස්නාහිර පළාත | ... | ... | — |
| මධ්‍යම පළාත | ... | ... | — |
| දකුණු පළාත | ... | ... | — |
| උතුරු පළාත | ... | ... | — |
| නැගෙනහිර පළාත | ... | ... | — |
| වයඹ පළාත | ... | ... | — |
| උතුරු මැද පළාත | ... | ... | — |
| ඌව පළාත | ... | ... | — |
| සබරගමු පළාත | ... | ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් | | ... | 459 |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් | | ... | 469 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් | | ... | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් | ... | ... | 471 |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම | | ... | — |


**සැලකිය යුතුයි.**—1961 ජනවාරි සිට ජූනි දක්වා නිකුත් අංක 12,266 සිට 12,501 තෙක් ඇති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රිකාවන්ට සූචියක් මෙම ගැසට් පත්‍රයට අතිරේකයක් වශයෙන් නිකුත් කර ඇත.

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

#### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑකෝරළේ (මැදපත්තුවේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, සිව්රළුමුල්ලේ පිහිටි, හොරගහලන්ද නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි අ. 0, රූ. 1, පර්. 1ක් පමණවූ කොටස :—

උතුරට : ඌරුවල-බැලුම්මහර ගම් සහා පාර; නැගෙනහිරට : සිව්රළුමුල්ලේ ඩබ්ලිව්. කේ. සයිමන් අප්පුහාමි අයිතිකම් කියන හොරගහලන්ද; දකුණට : සිව්රළුමුල්ලේ ඩබ්ලිව්. කේ. වරේලිස් අප්පුහාමි අයිතිකම් කියන හොරගහලන්ද; බස්නාහිරට : නැදුන්ගමුවේ පී. ඩී. පී. ධම්විජය අයිතිකම් කියන හොරගහලන්දේ ඉතිරි කොටස.

2. කොළඹ දිස්ත්‍රික්කයේ, බටහිර සියනෑ කෝරලේ (මැදපත්තුවේ) ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ සිව්රළුමුල්ලේ පිහිටි, හොරගහලන්ද නමැති ඉඩමෙන් පහත සඳහන් මායිම් තුළ පිහිටි පර්. 5 ක් පමණවූ බිම් කොටස :—

උතුරට : නැදුන්ගමුවේ පී. ඩී. පී. ධම්විජය මහත්මයා, අයිතිකම් කියන හොරගහලන්ද (අත්කර ගැනීමට අදහස් කරන ඉඩම); නැගෙනහිරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස; බස්නාහිරට : නැදුන්ගමුවේ පී. ඩී. පී. ධම්විජය මහත්මයා අයිතිකම් කියන හොරගහලන්ද.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ 61/62 ඊ. 168/කපුඩී 118,

1962 ජූලි මස 5 වැනි දින, කොළඹ දීය.

7-828 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

### 1962 අංක 321 දරණ ආඥාව

යොමු අංකය : ජේ 60/61 ඊ 33/ආර්. කිව්. 321.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ආණ්ඩුවේ දිසාපතිට, ආණ්ඩුවේ උප දිසාපතිට නැතහොත් එකී ආණ්ඩුවේ දිසාපති හෝ ආණ්ඩුවේ උප දිසාපති හෝ විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දැක්වෙන නියමිත ඉඩම, ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

කොළඹ, 1962 ජූලි මස 11 දින.

### උපලේඛනය

| I | II |
|---|---|
| ආණ්ඩුවේ දිසාපති, ආණ්ඩුවේ උප දිසාපති නැතහොත් බලය ලත් වෙනත් නිලධාරියා | ඉඩමේ විස්තරය |
| කොළඹ දිස්ත්‍රික්කයේ අතිරේක දිසාපති හෝ ඔහුගෙන් බලය ලත් වෙනත් නිලධාරියෙක්. | 1. කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ නාගරිකයේ මාලිගාවත්ත කොට්ඨාශය තුළ පිහිටි, සිරි සද්ධම් මාවතේ වරිපනම් අංක 34 දරණ, ප්‍රමාණයෙන්, රූඩ් 2, පර්චස් 11.37ක් පමණවූ ඉඩම් කොටසට මායිම් වශයෙන් :—<br>**උතුරට** : සිරි සද්ධම් මාවත ; නැගෙනහිරට : දුම්රිය දෙපාර්තමේන්තුව විසින් අයිතිකම් කියනු ලබන සිරි සද්ධම් මාවතේ වරිපනම් අංක 64/72 සිට 64/92 දරණ ඉඩම ; දකුණට : කොළඹ සිරි සද්ධම් මාවතේ අංක 265/5 දරණ ස්ථානයේ පදිංචිව සිට නැසීගිය ඒ. සී. අබ්දීන් මහතාගේ උරුමක්කාරයින් විසින් අයිතිකම් කියනු ලබන සිරි සද්ධම් මාවතේ වරිපනම් අංක 100/20 දරණ ඉඩම් සහ මාලිගාවත්තේ අංක 100/25 දරණ නාගරික පිං බෙහෙත් ශාලාව ; බස්නාහිරට කොළඹ යාල ගොඩනැගිල්ලේ චර්ච් මිසනාරි ට්‍රස්ට් සමිතිය මගින් අයිතිකම් කියනු ලබන සිරි සද්ධම් මාවතේ, වරිපනම් අංක 30/1 සිට 27 දරණ ඉඩම, කොළඹ මාලිගාවත්තේ අංක 102 දරණ ස්ථානයේ ඇස්. ඇම්. ඉසැඩ් ආබ්දීන් විසින් අයිතිකම් කියනු ලබන මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 100/15 දරණ ඉඩම. (අත්කර ගැනීමට අදහස් ඇති).<br>2. කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි තැනගේ කොට්ඨාශයේ, කොළඹ නාගරිකයේ මාලිගාවත්ත කොට්ඨාශය තුළ පිහිටි, මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 100/20 දරණ ප්‍රමාණයෙන් පර්චස් 22.12 ක් පමණවූ බිම් කැබැල්ලට මායිම් වශයෙන් :—<br>උතුරට : කොළඹ සිරි සද්ධම් මාවතේ, අංක 265/5 දරණ ස්ථානයේ සිට නැසීගිය ඒ. සී. ආබ්දීන් මහතාගේ උරුමක්කාරයින් විසින් අයිතිකම් කියනු ලබන මාලිගාවත්ත පාරේ, වරිපනම් අංක 34 දරණ ඉඩම) අත්කර ගැනීමට අදහස් කරන ඉඩම) ; නැගෙනහිරට : කොළඹ ජේඹ්ග්‍රොව් ඇවිනියු හි අංක 21 දරණ ස්ථානයේ පදිංචි දොස්තර ඇම්. ඇස්.. ඇම්රමාහිම් විසින් අයිතිකම් කියනු ලබන මාලිගාවත්ත පාරේ, වරිපනම් අංක 100/25 දරණ නාගරික පිං බෙහෙත් ශාලා භූමිය ; දකුණට : අඩි 40 පාරකට වෙන් කරන ලද ඉඩම ; බස්නාහිරට : කොළඹ මාලිගාවත්ත පාරේ අංක 102 දරණ ස්ථානයේ පදිංචි ඇස්. ඇම්. ඉසැඩ් අබ්දීන් මහතා විසින් අයිතිකම් කියනු ලබන මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 100/15 දරණ ඉඩම) අත්කර ගැනීමට අදහස් කරන).<br>3. කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොළඹ නාගරිකයේ, මාලිගාවත්ත කොට්ඨාශ තුළ පිහිටි මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 100/15 දරණ ප්‍රමාණයෙන් පර්චස් 22.81 ක් පමණවූ ඉඩම් කොටසට මායිම් :—<br>උතුරට : කොළඹ යාල ගොඩනැගිල්ලේ චර්ච් මිෂනාරි ට්‍රස්ට් සමිතිය විසින් අයිතිවාසිකම් කියනු ලබන සිරි සද්ධම් මාවතේ වරිපනම් අංක 30/1 සිට 27 දරණ ඉඩම් (අත්කර ගැනීමට අදහස් කරන ඉඩම) හා කොළඹ පරණ කොළොන්නාව පාරේ සිට නැසීගිය ඇග්නස් විජේමාන්න මහත්මියගේ උරුමක්කාරයින් විසින් අයිතිකම් කියනු ලබන සිරි සද්ධම් මාවතේ, වරිපනම් අංක 30/1 සිට 27 දරණ ඉඩමෙන් කොටසක් ; නැගෙනහිරට : කොළඹ සිරි සද්ධම් මාවතේ අංක 265/5 දරණ ස්ථානයේ සිටි නැසීගිය ඒ. සී. ආබ්දීන් මහතාගේ උරුමක්කාරයින් විසින් අයිතිකම් කියනු ලබන සිරිසද්ධම් මාවතේ වරිපනම් අංක 34 දරණ ඉඩම සහ මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 100/20 දරණ ඉඩම. (අත්කර ගැනීමට අදහස් කරන ඉඩම) ; දකුණට : අඩි 40 පාරකට වෙන් කරන ලද **ඉඩම ; බස්නාහිරට :** කොළඹ, මොහිදීන් මස්ජිඩ් පාරේ අංක 57/8 දරණ **ස්ථානයේ,** පදිංචි කේ. පී. අප්පුහාමි මහතා සහ මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන මාලිගාවත්ත පාරේ වරිපනම් අංක 100/10 දරණ ඉඩම. |

7-820 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම මහජන කාර්‍ය්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, අළුත්ගම ගම්මුලාදෑනි වසමේ, අළුත්ගම ගමේ පිහිටි ඔබිල්ලා වත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 1 ක් පමණවූ පහත සඳහන් මායිම් ඇතුළත පිහිටි බිම් කොටස :—

උතුරට : ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ; නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස්.

සී. පී. ද සිල්වා,
කෘෂිකම්, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

සඳහන් අංකය : ජේ. 61/62 ඊ. 320/ඇල් ඞී/ඊ/72.

1962 ජූලි මස 3 දින,
කොළඹ දී ය.

7-959 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරි මාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ, ප්‍රාදේශීය ආදයම් නිලධාරි කොට්ඨාශයේ දෙහිවල-ගල්කිස්ස නාගරිකය තුළ පිහිටි කව්ඩානේ, කව්ඩාන පාරේ වරිපනම් අංක 46 දරණ පිරිමණවත්ත නොහොත් දෙල්ගහ වත්ත නමැති ඉඩමෙන්, සාමාන්‍ය ප්‍රමාණයෙන් (අ) අඩි 14 × අඩි 15 × අඩි 6 ත්‍රිකෝණාකාර ඉඩම් කැබැල්ලටද (ආ) අඩි 210 × අඩි 12 වූ බිම් තීරයකටද (ඉ) අඩි 190 × අඩි 170 × අඩි 9 ක්වූ ත්‍රිකෝණාකාර වෙන්වූ ඉඩම් කැබැල්ලකින් ද සමන්විතවූ ඉඩම් කැබැලි තුනට මායිම් :—

උතුරට : කව්ඩාන පාර ; දකුණට : කව්ඩාන පාරේ වරිපනම් අංක 50/3 දරණ ස්ථානය සහ දෙවට පාර ; නැගෙනහිරට : කව්ඩාන පාරේ වරිපනම් අංක 50 සහ 50/1 දරණ ස්ථානයන් සහ දෙවට පාර ; බස්නාහිරට : කව්ඩාන පාරේ වරිපනම් අංක 46 දරණ ස්ථානය.

(2) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ, ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ දෙහිවල-ගල්කිස්ස නාගරිකය තුළ දෙහිවල කව්ඩාන පාරේ වරිපනම් අංක 42/5 සහ 42/6 දරණ දෙල්ගහවත්ත නැමැති ඉඩමෙන් සාමාන්‍ය ප්‍රමාණයෙන් අඩි 87 × අඩි 3½ක් පමණ වූ බිම් තීරයකට මායිම් :—

උතුරට : දෙහිවල-කව්ඩාන පාරේ වරිපනම් අංක 46 දරණ ස්ථානය ; දකුණට : දෙහිවල-කව්ඩාන පාරේ වරිපනම් අංක 36/5 සහ 36/6 දරණ ස්ථානයන් ; නැගෙනහිරට : දෙවට පාර ; බස්නාහිරට : කව්ඩාන පාරේ වරිපනම් අංක 42/5 සහ 42/6 දරණ ඉඩම්වලින් ඉතිරි කොටස්.

(3) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, දෙහිවල-ගල්කිස්ස නාගරිකය තුළ, දෙහිවල-කව්ඩාන පාරේ වරිපනම් අංක 36/5 සහ 36/6 දරණ අඹගහවත්ත නැමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 100 × අඩි 12ක්වූ බිම් තීරයකට සහ අඩි 100 × අඩි 20 × අඩි 90ක්වූ ත්‍රිකෝණාකාරී වෙන්වූ කැබැල්ලකින් ද සමන්විතවූ ඉඩම් දෙකකට මායිම් :—

උතුරට : කව්ඩාන පාරේ වරිපනම් අංක 42/5 දරණ ස්ථානය ; නැගෙනහිරට : ජෝස්ලින් මොනිකා ද මැල් විසින් අයිතිකම් කියනු ලබන දෙල්ගහවත්ත නමැති ඉඩම සහ අඩි පාර ; දකුණට : දෙවට පාර ; බස්නාහිරට : දෙහිවල-කව්ඩාන පාරේ වරිපනම් අංක 36/5 සහ 36/6 දරණ ස්ථානයන්ගෙන් ඉතිරි කොටස්.

(4) කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, දෙහිවල-ගල්කිස්ස නාගරිකය තුළ දෙහිවල පල්ලි දොර පාරේ වරිපනම් අංක 53 දරණ දෙල්ගහවත්ත නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අඩි 50 × අඩි 3ක් වූ බිම් තීරයකට මායිම් :—

උතුරට : කව්ඩාන පාරේ වරිපනම් අංක 36/5 සහ 36/6 දරණ ස්ථානයන් ; නැගෙනහිරට : දෙවට පාර ; දකුණට : මෝඩ් ඇම්. පෙරේරා මහත්මිය විසින් අයිතිකම් කියනු ලබන දෙල්ගහවත්ත නැමති ඉඩම ; බස්නාහිරට : පල්ලිදොර පාරේ වරිපනම් අංක 53 දරණ ස්ථානයෙන් ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 57/58. එල්ජී. 699 ; ආර්/කිව් 232.

1962 ජූලි මස 4 දින,
කොළඹදීය.

7-1027 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වෙනි පරිච්ඡේදයේ) 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කොළඹ දිස්ත්‍රික්කයේ බටහිර සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ කැළණිය ගමේ පිහිටි ඉයුබන් වත්ත නමැති ඉඩමෙන් පර්චස් තුනක් (3) පමණ ප්‍රමාණය ඇති බිම් කැබැල්ලට මායිම් :—

උතුරට සහ නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ; දකුණට : කැළණිපුර නිවාස යෝජනා ක්‍රමයේ පාර ; බස්නාහිරට : කොහල්විල-වරාගොඩ ගම්සභා පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 61-62 එල්ජී 269/කිව්.සී. 174.

1962 ජූලි මස 4 දින,
කොළඹ දී ය.

7-1028 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : එම්ඒවී/ඒසී/7717/60.

## 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනත

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධි විධාන යටතේ අත්කර ගනු ලබන බවත්, 1954 අංක 39 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

1 කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නාගරික සහා සීමාව තුල මහවත්ත කොට්ඨාශයේ පිහිටි පර්ගියුසන්ස් පාරේ තක්සේරු අංක 16, 20, 24 සහ 26 දරණ ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 7.34 ක් වූ ස්ථාන වලට මායිම්:—

උතුරට : කැළණි ගඟ ; නැගෙනහිරට : පර්ගියුසන්ස් පාරේ තක්සේරු අංක 14 දරණ ස්ථානය ; දකුණට : පර්ගියුසන්ස් පාර ; බටහිරට : පර්ගියුසන්ස් පාරේ තක්සේරු අංක 30 දරණ ස්ථානය සහ පර්ගියුසන්ස් පාර.

2. කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නගර සභා සීමාව තුල මහවත්ත කොට්ඨාශයේ පිහිටි, පර්ගියුසන්ස් පාරේ තක්සේරු අංක 30 සහ 32 දරණ ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, ප. 02.16 ක් වූ ස්ථානවලට මායිම් :—

උතුරට : කැළණි ගඟ ; නැගෙනහිරට : පර්ගියුසන්ස් පාරේ තක්සේරු අංක 26 දරණ ස්ථානය (ඉඩම් කොටස් අංක 1 හි කොටසක්) ; දකුණට : පර්ගියුසන්ස් පාර ; බටහිරට : පර්ගියුසන්ස් පාරේ තක්සේරු අංක 30 දරණ ස්ථානයේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති.

යොමු අංක ජේ 60/61 ඇල් ජී 456.

1962 මාර්තු මස 23 දින,
කොළඹදීය.

7-1036—62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

පහත විස්තර කරන ඉඩම් මහජන කාර්‍යයක් සඳහා අවශ්‍යයයි ද, එබැවින් එම පනතේ විධිවිධාන යටතේ එය අත්කර ගනු ලැබේ යයි ද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ මෙසින් ප්‍රකාශ කරමි.

මහනුවර දිස්ත්‍රික්කයේ පාත දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, වලල ගම්මුලාදෑනි වසමේ, වානේතට්ටුව ගම් මැද්දේ පිහිටි පට්ටිය තැන්නෙවත්ත නැමැති ප්‍රමාණයෙන් අ. 17½ පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :—

උතුරට : පී. බී. වීරසේකර හිමිකම් කියන මුතුකුඩේ වලව්වේ හේන, ඊ. ඇම්. කළුබන්ඩා හිමිකම් කියන ඉඩම සහ වලල ගම්සභා පාර ; නැගෙනහිරට : වයි. එම්. අප්පුහාමි, එච්. බී. විජයතුංග සහ ඩබ්ලිව්. එම්. කිරිබණ්ඩා හිමිකම් කියන හුණුඅඟේවත්ත, එම්. අබුහනිපා හිමිකම් කියන ගෙම්බාදෙනියෙ කුඹුර සහ ප්‍රේමලතා විජේතුංග හිමිකම් කියන ගොරොක්ගහකුඹුර වත්ත ; දකුණට : මඩවල-තෙල්දෙණිය ප්‍රසිඩ පාර, බී. කේ. අන්දිරිස් අප්පුහාමි, ඊ. එම්. මද්දුම බණ්ඩා, ඊ. එම්. රන්මැණිකා සහ ඊ. එම්. ලොකු බණ්ඩා හිමිකම් කියන බටවල තැන්න කුඹුරුයාය ; බස්නාහිරට : ප්‍රසිඩ පාර, ටී. බී. වීරසිංහ, කේ. එච්. ඩේවිඩ් සිල්වා සහ ඊ. එම්. කිරි බණ්ඩා හිමිකම් කියන කොස්කොළතැන්නෙ වත්ත.

2. මහනුවර දිස්ත්‍රික්කයේ, පාත දුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, වලල ගම්මුලාදෑනි වසමේ වානේකට්ටුව ගම්මැද්ද ගමේ පිහිටි පට්ටියෙ තැන්නෙ වත්ත නැමැති ප්‍රමාණයෙන් අක්කර 2 ක් පමණවූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම :—

උතුරට : පී. බී. වීරසේකර හිමිකම් කියන ඉඩමේ ඉතිරි කොටස ; නැගෙනහිරට : ගම්සභා පාර ; දකුණට : පී. බී. වීරසේකර හිමිකම් කියන මුතුකුඩේ වලව්හේන ; බස්නාහිරට : පී. බී. වීරසේකර හිමිකම් කියන ඉඩමේ ඉතිරි කොටස.

සී. පී ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 61/62 එල් 68 (වීඊ)/එල්ඩී./බී. 69

1962 ජූලි මස 6 වන දින,
කොළඹදී ය.

7-1003 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කරගැනීමේ පනත (460 වෙනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමැති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙසින් ප්‍රකාශ කරමි.

මාතලේ දිස්ත්‍රික්කයේ, නැගෙනහිර මාතලේ ප්‍රාදේශීය ආදායම් නිලධාරිතැනගේ කොට්ඨාශයේ, පල්ලේගම වසමේ, කයිකාවල ගමේ පිහිටි, කයිකාවල වත්ත නැමැති ඉඩමෙන් (අංක ඒ. 827 දරණ මූලික සැළැස්මේ බිම් කට්ටි 9) ප්‍රමාණයෙන් රූඩ් 3ක් පමණ වූ පහත දැක්වෙන මායිම් තුළ වූ ඉඩම් කොටස :—

උතුරට : කායිකාවල වත්ත (අංක ඒ. 909 දරණ මූලික සැළැස්මේ බිම් කට්ටි 15) (රජය සතු) ; නැගෙනහිරට : කයිකාවල වත්ත (අංක ඒ. 909 දරණ මූලික සැළැස්මේ බිම් කට්ටි 15), (රජය සතු) ; දකුණට සහ බස්නාහිරට : මෙම ඉඩමේම ඉතුරු කොටස් (අංක ඒ. 827 දරණ මූලික සැළැස්මෙ බිම් කට්ටි 9).

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 61/62 එල්. 3 (වීඊ)

1962 ජූනි මස 29 වෙනි දින,
කොළඹ දී ය.

7-976 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙසින් ප්‍රකාශ කරමි.

ගාළු දිස්ත්‍රික්කයේ, කල්පේපත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කොට්ටව සහ මාබොටුවන ගම්පති වසම් තුළ කොට්ටව සහ මාබොටුවන ගම්වල පිහිටි :

(1) හෙල්කිරිමැටියාව ඔවිට (661 දරණ අ. ග. සැලැස්මේ 17 දරණ කැබැල්ලෙන් කොටසක්)

(2) හෙල්කිරිමැටියඔකන්ද (661 දරණ අ. ග. සැලැස්මේ 18 දරණ කැබැල්ලෙන් කොටසක්)

(3) අම්බලමගාව ලියද්ද ඔවිට (661 දරණ අ.ග. සැලැස්මේ 19 දරණ කැබැල්ලෙන් කොටසක්)

(4) කිරිමැටිය කුඹුර (661 දරණ අ. ග. සැලැස්මෙ 50 දරණ කැබැල්ලෙන් කොටසක්)

(5) හෙල්කිරිමැටිය කුඹුර (662 දරණ අ.ග.සැ. 334 දරණ කැබැල්ලෙන්, කොටසක්) නමැති ප්‍රමාණයෙන් පර්චස් 32ක් පමණ ඇති පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කැබලි 5 :—

**661 දරණ අ. ග. සැ. අංක 17 දරණ කැබැල්ලේ කොටස**

උතුරට : මාබොටුවන ගම් සීමාව ; නැගෙනහිරට : එම කැබැල්ලේම කොටසක් ; දකුණට : අංක 661 දරණ අ. ග සැ. අංක 18 දරණ කැබැල්ල ; බටහිරට : මාබොටුවන ගම් සීමාව.

**661 දරණ අ.ග.සැ. අංක 18 දරණ කැබැල්ලේ කොටස**

උතුරට : අංක 661 දරණ අ. ග. සැ. 17 වැනි කැබැල්ල ; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ; දකුණට : අංක 661 දරණ අ. ග. සැ. 19 වැනි කැබැල්ල ; බටහිරට : මාබොටුවන ගම් සීමාව.

**661 දරණ අ. ග. සැ. අංක 19 දරණ කැබැල්ලේ කොටස**

උතුරට : අංක 661 දරණ අ. ග. සැ. 18 වැනි කැබැල්ල ; නැගෙනහිරට : එම ඉඩමේම කොටසක් ; දකුණට : 661 දරණ අ. ග. සැ. 50 දරණ කැබැල්ලේ කොටසක් ; බටහිරට : මාබොටුවන ගම් සීමාව.

**661 දරණ අ. ග. සැ. අංක 50 දරණ කැබැල්ලේ කොටස**

උතුරට : මාබොටුවන ගම් සීමාව හා අංක 661 දරණ අ.ග.සි. 19 වැනි කැබැල්ල ; නැගෙනහිරට : එම කැබැල්ලේම ඉතිරි කොටස ; දකුණට : ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : මාබොටුවන ගම්සීමාව.

**662 දරණ අ. ග. සැ. අංක 334 දරණ කැබැල්ලේ කොටස**

උතුරට හා නැගෙනහිරට : කොට්ටව ගම් සීමාව ; දකුණට : ප්‍රසිද්ධ පාර ; බස්නාහිරට : එම කැබැල්ලේම ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 61/62 එල් 164 (වීඊ)/ඉට/2/205.

1962 ජූනි මස 23 දින,
කොළඹ දීය.

7-945 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

අංකය : එල්ඒ. 1186.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කරගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

යාපනය දිස්ත්‍රික්කයේ තෙන්මරාච්චි ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නාවත්කුළි ගමේ පිහිටි, නාවත්කුළිතෙන් නම් නමැති ඉඩමෙන් අක්කර 96 ක් පමණ ප්‍රමාණය ඇති පහත සඳහන් බිම් කැබලි 3 ට මායිම් :—

(1) උතුරට: දුම්රිය මාර්ගය දිගේ ඇති රක්ෂිත ඉඩම; නැගෙනහිරට: නාවච්කුල්හි වේට්ටිවේලු තිරුඥානසම්පන්දන් නැමැති අයට අයිති ඉඩම, වෛතිලිංගම් ශන්මුගම්, සින්නතම්බි අප්පපිල්ලෙයි සහ අනිකුත් අයට සෙම්පඩ්ඩුතෝට්ටම් නැමැති ඉඩම, නාවච්කුල්හි ක්‍රිෂ්ණ දේවිබජරන්ග්ලාල් මහත්මියට අයිති අක්කර දහයක්වූ ඉඩමට යෑමට අඩි 20 ක් පළලැති පාරක් සඳහා වෙන්කර ඇති ඉඩම සහ ඉහතින් දැක්වූ අක්කර 10 යේ ඉඩමේ බස්නාහිර මායිම; දකුණට: නාවච්කුල්හි ක්‍රිෂ්ණදේවි බජරන්ග්ලාල් මහත්මියට අයිති පුද්ගලික කුඹුරු ඉඩම සහ රජයේ ඉඩම; බස්නාහිරට: දුම්රිය මාර්ගය දිගේ ඇති රක්ෂිත ඉඩම.

(2) උතුරට: සිතම්බරම් අම්බලවානර් ස්වාමි කෝවිලට අයිති 78739 දරණ හිමිකම් පිඹුරේ කොටස; නැගෙනහිරට: 78739 දරණ හිමිකම් පිඹුරේ කොටසක් වූ සින්නදියර් වත්ත; දකුණට: නාවච්කුල්හි ගම්කායයි සභාව හිමිකම් කියන සෙම්පඩ්ඩු පටුමග; බස්නාහිරට: ත්‍යාගර් නවරත්නම් සහ තවත් අය හිමිකම් කියන "සෙම්පඩ්ඩුතෝට්ටම්" නැමැති ඉඩම.

(3) උතුරට: නාවච්කුලි ගම්කායයි සභාව අයිතිකම් කියන සෙම්පඩ්ඩු පටුම්ග; නැගෙනහිරට: නල්ලූර්හි වයිමන් පාරේ ඇස්. කුමාරස්වාමි මහතා අයිතිකම් කියන ඉඩම; දකුණට: ක්‍රිෂ්ණ දේවි බජරන්ග්ලාල් මහත්මියට අයිති කුඹුරු ඉඩම සහ ගොඩ ඉඩම්; බස්නාහිරට: ක්‍රිෂ්ණදේවි බජරන්ග්ලාල් මහත්මිය අයිතිකම් කියන අක්කර 10 ක ගොඩ ඉඩම් කොටස සහ සින්නදියර් වත්තේ කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 59/60 එස් 60

1962 ජූලි මස 5 දින,
කොළඹදීය.

7-1031 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (I) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මඩකලපු දිස්ත්‍රික්කයේ, දකුණු මන්මුනායි සහ එරවිල් පොරතිව් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසේ තම්පලාවත්ත ගමේ තම්පලාවත්ත ගම්පති වසමෙහි පිහිටි ප්‍රමාණයෙන් අ. 1, රූ. 0, ප. 15 ක් පමණවූ පනිච්චයාදිපල්ලම් නැමති ඉඩමට මායිම් :—

උතුරට: මන්දූර්හි තම්පලාවත්තේ එස්. අලගයියා සහ තවත් අය හිමිකම් කියන පනිච්චියාදිපල්ලම් නැමති ඉඩම; නැගෙනහිරට: මනුදූර්හි තම්පලාවත්තේ කේ. කෝනාතෙයි සහ එස්. අලගයියා සහ මනුදූර්හි 1 වෙනි කොටසෙහි කේ. මුත්තුපිල්ලෙයි යන අය අයිතිකම් කියන කයන් ආච්පල්ලම නැමති ඉඩම; බස්නාහිරට: මන්දූර්හි තම්පලාවත්තේ කේ. එළියතම්බි සහ උම්මුනියර් කනපතිපිල්ලේ යන අය අයිතිකම් කියන පනිච්චියාදිපල්ලම් නැමති ඉඩම; දකුණට: මනුදූර්හි තම්පලාවත්තේ කේ. එළිතම්බි සහ උම්මූනියාර් කනපති පිල්ලේ යන අය අයිතිකම් කියන පනිච්චියාදිපල්ලම නැමති ඉඩම සහ ගම්සභා පාර.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 59/60 ඊ 662,
1962 ජූනි මස 23 වැනි දින,
කොළඹ දීය.

7-846 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (I) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

මඩකලපුව දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනායි පත්තු ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසෙහි අමිර්තගලි ගම්පති වසමෙහි, මඩකලපුව නගර සභාවේ කොට්ඨාශ අංක 10—කොට්ටමුනෙයිහි පිහිටි අක්කර 3 න් ප්‍රමාණයකින් යුත් බාර් පාරේ වරිපනම් අංක 93 දරණ රෝමානු කතෝලික වසමේ පොල් වත්ත, නැමති ඉඩම් කැබැල්ලට මායිම් :—

උතුර: කේ. වී. මයිල්වාගනම්, කේ. කන්දයියා, කේ. රාජදුරෙයි සහ වාමදේවන් යන අය අයිතිකම් කියන වාඩිවලව් නැමති ඉඩම; නැගෙනහිරට: බාර් පාර; දකුණට: එස්. සෙල්ලපිල්ලේ අයිතිකම් කියන උලක්කයර්වලව් නොහොත් අයියාර්වලව් නැමති ඉඩම; බස්නාහිරට: ඒ. ගනේෂමුදලි අයිතිකම් කියන සභාපතිපිල්ලේයාර්වලව් නැමති ඉඩම.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 61-62 එල්ජී 264.
1962 ජූලි මස 4 දින,
කොළඹ දීය.

7-847 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත(460 වෙනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

හලාවත දිස්ත්‍රික්කයේ, දකුණු පිටිගල් කෝරළේ, රංගම්මුල්ල ගම් මුලාදෑනි වසමේ, උතුරු කම්මල්ගමේ පිහිටි පර්චස් 3½ ක් පමණවූ කෝන්ගහවත්ත නැමති ඉඩමේ පහත සඳහන් මායිම් තුලවූ ඉඩම් කොටස :—

උතුරට: මෙම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට සහ දකුණට: ගින් ඔය-බෝලවත්ත-දන්කොටුව ප්‍රසිද්ධ පාර; බස්නාහිරට: ගින් ඔය ඇල.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමති.

යොමු අංකය : ජේ. 61/62 පී. 257—ඇල් ඒ. 3850
1962 ජූනි මස 23 දින,
කොළඹදීය.

7-844 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ, බස්නාහිර මැදපත්තු කෝරළේ, කදිරපොල පළාතේ, ඉංගුරුදවුල නමැති ගමෙහි පිහිටි බෝගහමූලවත්ත නොහොත් ඉහළවෙල වත්ත නොහොත් කහටගහමූලගේන (අංක 343 දරණ අ. ග. සැ. කට්ටි නො. 5) නමැති ඉඩමෙන් අ. 1, රූ. 0, ප. 0 පමණ විශාල පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් කොටස :—

උතුරට : පරගම්මන-හොරකැලේ ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට : ඇරැපොළට යන අඩි පාර (එම ඉඩමේ ඉතිරි කොටස අංක 343 දරණ අ. ග. සැ. 5 වෙනි කට්ටිය); දකුණට : ඩබ්ලිව්. එම්. සියාතු බණ්ඩා හිමිකම් කියන ඉහළවෙල වත්ත නමැති ඉඩම; බස්නාහිරට : පාසල් වත්ත (අංක 343 දරණ අ. ග. සැ. 1 අතිරේකයේ 24 කට්ටිය).

2. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොළ හත්පත්තුවේ, බස්නාහිර මැදපත්තු කෝරළේ, කදිරපොල පළාතේ, ඉංගුරුදවුල නමැති ගමේ පිහිටි ඉහළවෙල වත්ත නොහොත් කහටගහමූලවත්ත (අංක 343 දරණ අ. ග. සැ. 6ඒ සහ 5ඒ දරණ කට්ටි) නමැති ඉඩමෙන් අ. 0, රූ. 1, ප. 00 පමණ විශාල පහත සඳහන් මායිම් තුළ පිහිටි බිම් ප්‍රමාණය :—

උතුරට : ඉංගුරුදවුල පාසැල් වත්ත සහ එච්. ඇම්. පුංචි අප්පුහාමි හිමිකම් කියන බෝගහමූලවත්ත නොහොත් ඉහළවෙල වත්ත නොහොත් කහටගහමූලගේන නමැති ඉඩම (අංක 343 දරණ අ. ග. සැ. 5 කට්ටිය); නැගෙනහිරට : ඇරැපොළට යන අඩිපාර සහ පීරිස් සිංඤෝ හිමිකම් කියන වැටකයාවත්ත නමැති ඉඩම; දකුණට : එම ඉඩමේ ඉතිරි කොටස් (අංක 343 දරණ අ. ග. සැ. 5ඒ, 6ඒ සහ 6 බිම් කට්ටි); බස්නාහිරට : බේබිනෝනා හිමිකම් කියන බෝගහමූල වත්ත නොහොත් ඉහළවෙල වත්ත නමැති ඉඩම (අංක 343 දරණ අ. ග. සැ. 5 බිම් කට්ටිය).

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක : ජේ. 59/60 ඊ 733 කෝ.
1962 ජූනි මස 23 වන දින,
කොළඹදීය.

7-821 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, නාවෙල ගම්මුලාදෑනි වසමේ, නාවෙල ගෝවුස්ස ගමේ පිහිටි ගෝවුස්සවත්ත (1 දරණ අ. ග. සැලැස්මේ අංක 600 දරණ බිම් කට්ටියෙන් කොටසක්) නමැති ඉඩමෙන් ප්‍රමාණයෙන් අක්කර 25ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ ඇති ඉඩම් කැබැල්ල :—

උතුරට : අංක 1 දරණ අ. ග. සැලැස්මේ 609, 611, 614, බී,614 ඒ,614 සහ 612 (මළකඳුර) දරණ බිම් කට්ටි; නැගෙනහිරට : අංක 1 දරණ අ. ග. සැලැස්මේ 599 දරණ බිම් කට්ටිය—ගම්සභා පාර; දකුණට : ඉද්දබැන්ද ආර (අංක 1 දරණ අ. ග. සැලැස්මේ 681 දරණ බිම් කට්ටිය); බටහිරට : ගෝවුස්ස ඔය සහ අංක 1 දරණ අ. ග. සැලැස්මේ 614 දරණ බිම් කට්ටිය.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල පිළිබඳ ඇමති.

යොමු අංකය : ජේ. 59/60 එල් 116 (වීඊ)
1962 ජූනි මස 19 දින,
කොළඹදීය.

7-914 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බදුල්ල දිස්ත්‍රික්කයේ, යටිකිඳ ආදායම් නිලධාරි කොට්ඨාශයේ කඳන ගම්මුලාදෑනි කොටසේ, පහළ කඳන ගමේ පිහිටි අංක 552 දරණ ගම් සිතියමේ කැබලි අංක 81න් දැක්වෙන ගොන්ගොල්ල නමැති ඉඩමෙන් පහත දැක්වෙන මායිම් තුළවූ ප්‍රමාණයෙන් අක්කර 10 ක් පමණ වූ කොටස :—

උතුරට : අංක 552 දරණ ගම් සිතියමේ අංක 33 දරණ කැබැල්ල සහ එම ඉඩමේම ඉතිරි කොටස; නැගෙනහිරට : අංක 552 දරණ ගම් සිතියමේ අංක 79, 23 සහ 33 දරණ කැබලි; දකුණට : අංක 552 දරණ ගම් සිතියමේ කැබලි අංක 32 දරණ තලමාරුවෙ ඇල සහ කැබලි අංක 80 සහ 82; බස්නාහිරට : අංක 552 දරණ ගම් සිතියමේ කැබැලි අංක 32 දරණ තලමාරුවෙ ඇල.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 61/62 ඇල්. 195 (වීඊ)
1962 ජූලි මස 12 දින,
කොළඹ දීය.

7-988 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

බදුල්ල දිස්ත්‍රික්කයේ උඩුකිඳ ආදායම් නිලධාරි කොට්ඨාශයේ කිරවනාගම ගම්මුලාදෑනි කොටසට අයත් උනපාන ගමේ පිහිටි අංක 439 දරණ අ.ග. සිතියමේ කැබලි අංක 37න් දැක්වෙන බෝගහවත්ත නැමැති ඉඩමෙන් පර්චස් 1.8 ක පමණ බිම් කැබැල්ලට මායිම් පහත දැක්වේ :—

උතුරට, නැගෙනහිරට, දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේම ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ 59/60ඊ 696.
1962 ජූලි මස 11 වැනි දින,
කොළඹ දීය.

7-989 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත මැද කෝරළේ, මොරහැල වසමේ ඕළුගන්තොට ගමේ පිහිටි මැදවත්ත (අංක 299 දරණ අ.ග.සි. ලොට් 22 න් කොටසක්) නමැති ඉඩමෙන් අක්කරයක් පමණ බිම් ප්‍රමාණය කට මායිම් :—

උතුරට : ඕළුගන්තොට-හතරබාග ගම්සභා පාර; නැගෙනහිරට : පී. තන්ගවේළු සහ තවත් අය අයිතිවාසිකම් කියන ගමගෙදර වත්ත නොහොත් නාරිඇල්ලෙගේන නමැති ඉඩම; දකුණට සහ බස්නාහිරට : එම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අකය : ජේ 61/62 ඇල්ජී. 310.
1962 ජූලි මස 5 දින,
කොළඹ දීය.

7-810 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත

5 වන වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම් පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, 1954 අංක 39 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත 1950 අංක 9 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරලේ පල්ලෙ පත්තුවේ ගඟුල්විටිය නමැති ගමේ පිහිටි, මුළු ප්‍රමාණයෙන් පර්චස් 10.91 ක් පමණ විශාල බණ්ඩාරඹිවිට (අංක 83 දරණ අ. ග. සි. අංක 9 දරණ කැබැල්ල) නමැති ඉඩමෙන් කැබලි 2 කට මායිම් :—

**(1) බණ්ඩාරඹිවිට—පර්චස් 9.29 ක් පමණ**

උතුරට : වාරිමාර්ග ඇල ; නැගෙනහිරට : ගම් සහා පාර ; දකුණට සහ බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

**(2) බණ්ඩාරඹිවිට—පර්චස් 1.62 පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : පලාපොල්වත්ත නමැති ඉඩම ; බස්නාහිරට : මුල්ලෙ ගන් ගොඩවත්ත නමැති ඉඩම.

රත්නපුර දිස්ත්‍රික්කයේ නවදුන් කෝරළේ, පල්ලෙ පත්තුවේ, හන්ගොමුව නමැති ගමේ පිහිටි මුළු ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 30.72 ක් පමණ විශාල මුල්ලෙගන් ගොඩවත්ත, පෙරමුනේ ගෙවත්ත, පැලපොල්වත්තෙඹිවිට, ජගරිතියෙඹිවිට, හපන්තලකයාගෙඹිවිට සහ බටුඹිවිට (අංක 83 දරණ අ. ග. සි. අංක 40 සහ 19 දරන කැබලි) නමැති ඉඩම් කැබලි 6 කට මායිම් :—

**(1) මුල්ලෙගන් ගොඩවත්ත—පර්චස් 14.14 ක් පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : පෙරමුනේ ගෙවත්ත නමැති ඉඩම ; බස්නාහිරට : හන්ගොමු ගඟ.

**(2) පෙරමුනේ ගෙවත්ත—පර්චස් 16.57 ක් පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට: පැලපොල්වත්තෙඹිවිට ; බස්නාහිරට : මුල්ලෙගන් ගොඩවත්ත නමැති ඉඩම.

**(3) පැලපොල්වත්තෙඹිවිට—පර්චස් 38.79 ක් පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : ජගරිතියෙඹිවිට ; බස්නාහිරට : පෙරමුනේ ගෙවත්ත නමැති ඉඩම.

**(4) ජගරිතියෙඹිවිට—පර්චස් 17 ක් පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : හපන්තලකයාගෙඹිවිට නමැති ඉඩම ; බස්නාහිරට : පැලපොල් වත්තඹිවිට නමැති ඉඩම.

**(5) හපන්තලකයාගෙඹිවිට—පර්චස් 8.89 ක් පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : බටුඹිවිට නමැති ඉඩම ; බස්නාහිරට : ජගරිතියෙඹිවිට නමැති ඉඩම.

**(6) බටුඹිවිට—පර්චස් 15.33 ක් පමණ**

උතුරට සහ දකුණට : මෙම ඉඩමේ ඉතිරි කොටස් ; නැගෙනහිරට : හපන්තිලකයාගේ ඹිවිට නමැති ඉඩම ; බස්නාහිරට : කුඹුරු.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංකය : ජේ. 60/61 ඇල් 145.

1962 පෙබරවාරි මස 22 දින,
කොළඹ දී ය.

7-944 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපණතින් සංශොධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත (460 වෙනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

කිව්. සි. 159.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශොධිත) ආඥාපනතින් සංශොධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම ලබාගනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්මේ අංකය : ඒ. 4908. ගම : වල්ගම.

කැ. අංකය : 1.

ඉඩමේ නම : බඩල්ගෙවත්ත ; විස්තරය : අවු. 12ක් පමණවූ අනෝදා ගසක් ද, අවු. 6ක් පමණවූ පැපොල් ගසක් ද, සාදාගෙන යනු ලබන මැසිකිලියක් ඇති ඉඩම ; අයිතිකරුගේ නම : ඇම්. ඇල්. උම්මු සජ්පියා මිම්., " පාතිමා විලා ", මල්වාන ; ප්‍රමාණය : අ. 0, රූ. 0, පර්. 04.37.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 සැප්තැම්බර් 8 වැනි දින පූ. භා. 10 ට කොළඹ, කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අගෝස්තු මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයක් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීම්ට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. රාජරත්නම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කර
ගැනීමේ නිලධාරි තැන.

1962 ජූලි 14 වැනි දින,
කොළඹ කච්චේරිය.

7-811 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

යොමු අංකය : ඇම්.ඒ/ඒ.සි./2816/53.

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැනුම් දීමයි

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ රජය මගින් ලබා ගන්නට අදහස් කරන බව මෙයින් දන්වා සිටිමි.

ලබා ගැනීමට අදහස් කර තිබෙන ඉඩමේ විස්තර :—

මූලික සැලැස්ම අංක ඒ 4,301. බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ නාගරික සහා සීමාව තුළ වැල්ලවත්ත දකුනේ, අංක 36 දරණ වැල්ලවත්ත දකුණ කොට්ඨාශය.

**කැබැල්ල : 1.**

ඉඩමේ නම : 57 වැනි පටු මගේ, තක්සේරු අංක 9 දරණ ස්ථානයේ කොටසක් ; විස්තරය : පොල් ගස් 1යි, අවුරුදු 30ක්වූ දිවුල් ගස් 1යි, පැපොල් ගස් 1යි, කෙසෙල් පඳුරු 8යි, ගලින් නිම කළ උළු සෙවිලි කරන ලද ගොඩනැගිල්ලක කොටසක් සහ ගේට්ටු කුලුණක් සහිත වූ වත්ත ; අයිතිවාසිකම් කියන්නා : **ඒ. මාරියදාසන්** පෙරකදෝරු තැන, අංක 9, 57 වැනි පටු මග, කොළඹ-6 ; **ප්‍රමාණය :** අ. 0, රූ. 0, ප. 05.32.

ඉහත සඳහන් ඉඩම පිළිබඳ අයිතිවාසිකම් කියා සිටින සියළු දෙනා විසින්ම 1962 සැප්තැම්බර් 4 දින සවස 2ට කොළඹ නාගරික කාර්යාල යේ දී පුද්ගලිකව හෝ ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නියෝජිත යෙකු ගේ මාර්ගයෙන් හෝ මා ඉදිරිපිට පෙනී සිටිය යුතුය. තවද අයිතිවාසිකම්වල ස්වභාවය ඉහත සඳහන් ඉඩම ලබා ගැනීමේ දී ඔවුන්ට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සහ එම ප්‍රමාණය ගණන් බැලූ විස්තර ඇතුලත් පිටපත් දෙකක් සහිත ලියවිල්ලකින් 1962.8.28 දින හෝ ඊට පෙර මා වෙත දැනුම් දිය යුතුය. සියළුම ඔප්පු සහ අයිතිවාසිකම් කියා සිටිය හැකි එයට අදාල සියළුම ලිය කියවිලි ඉහත කී දිනයේ දී මට ඉදිරිපත් කළ යුතුය.

බී. ඒ. ජයසිංහ,
නාගරික කොමසාරිස් සහ කොළඹ ඉඩම්
ලබාගැනීමේ නිලධාරි තැන.

1962 ජූලි මස 19 වැනි දින,
නාගරික කොමසාරිස් කාර්යාලය, කොළඹ.

7-940 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ බදුල්ල පළාත් ආණ්ඩු සභා සීමාවේ පිංඅරාව කොට්ඨාශයේ බදුල්ල නගර මූලාදෑනි කොට්ඨාශයේ පිහිටි වරිපනම් අංක 284 දරණ අළුත්ගෙදරවත්ත නැමැති ඉඩමෙන් (අංක 43 දරණ නගර මැනුමේ සැලැස්මේ 8 වෙනි පිටුවේ කට්ටි අංක 64 න්) පර්චස් 23 ක් පමණ ප්‍රමාණය ඇති බිම් කොටසට මායිම් :—

උතුරට : අංක 43 දරණ නගර මැනුම් සැලැස්මේ කට්ටි අංක 65 දරන පොල්ගස්වත්ත ; නැගෙනහිරට : බැම්ම සහ අඩි පාර ; දකුණට : අංක 43 දරණ නගර මැනුම් සැලැස්මේ කට්ටි අංක 63 දරණ අත්නාසිවත්ත ; බස්නාහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 61-62 `එස්. 242.

7-987 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (I) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගල්බඩ සහ කිනිගොඩ දෙකෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, කිනිගොඩ කෝරළේ, දියසුන්නත වසමේ, මොට්ටප්පුලිය නමැති ගමේ පිහිටි වාඩිය කනත්ත වත්ත නැමති ඉඩමෙන් ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, ප. 16ක් පමණවූ පහත සඳහන් මායිම් තුළවූ බිම් කොටස :—

උතුරට : වික්ටර් රාජපක්ෂ සහ ඇස්. ඇල්. ඇම්. හනීෆා යන අය හිමිකම් කියන වාඩියකනත්ත වත්ත නැමැති ඉඩම ; නැගෙනහිරට : ඇස්. ඇල්. ඇම්. හනීෆා හිමිකම් කියන වාඩිය කනත්ත වත්ත නැමැති ඉඩම ; දකුණට : කටුපිටිය—රඹුක්කන ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ පාර ; බස්නාහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 61/62 එන්එස්. 451.

1962 ජූලි මස 7 දින කොළඹ දීය.

7-848 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

**5 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කරගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම මෙයින් ප්‍රකාශ කරමි.

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිටි කෝරළේ, උඩපත්තු උතුරේ බටතොට ගමේ පිහිටි ප්‍රමාණයෙන් අක්කර 2 ක් පමණ වූ ගල්කොටුවෙහේන්යාය නොහොත් දෙල්ගහදෙනියගාවාහේන්යාය නොහොත් හීන්මෝදරගාවා හේන්යාය සහ ගල්කොටුවෙහේන්යාය වත්ත (355 අ. ග.සි. ලොට් 16ඒ, 16බී සහ 16න් කොටසක්) නමැති ඒකාබද්ධ ඉඩම් කැබලි 3 ට මායිම් :

උතුරට : අංක 355 දරණ අ. ග. සි. ලොට් 11 දරණ කේ. ඒ. දවිත් සිංඤෝට අංක 35/2353 දරණ අවසරපත්‍ර යටතේ වගාවට දී තිබෙන ගල්කොටුවෙහේන්යාය ද ඉහත කී සිතියමේ ලොට් 17 දරණ කේ. ඒ. පුංචිඅප්පුහාමි සහ තවත් අය විසින් අයිතිවාසිකම් කියන ළිඳ ගාවා කුඹුර ද, ඉහත කී සිතියමේ ලොට් 11 ඒ දරණ කේ. වී. කිරානිස් සිංඤෝ සහ එස්. ඒ. පුංචිනෝනා යන අය අයිතිකම් කියන ගල්කොටුවෙහේනවත්ත ; නැගෙනහිරට : ගම්සභා පාර (රජය සතු 355 අ. ග. සි. ලොට් 28) ; දකුණට : ගම්සභා පාර (355 අ. ග සි. ලොට් 16 සී සහ 16ඒ) ; බස්නාහිරට : ගම්සභා පාර (355 අ.ග.සි. ලොට් 16 සී) සහ පී. ඕ. එස්. අබේවර්ධන අයිතිකම් කියන 355 අ.ග.සි. ලොට් 16න් කොටසක් වන ගල්කොටුවෙහේන ආදිය.

සී. පී. ද සිල්වා,
කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති.

යොමු අංක ජේ. 59/60 ඊ 351.

1962 මැයි මස 26 වන දින,
කොළඹ දී ය.

7-962 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණත (460 වැනි පරිච්ඡේදය)

**7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි**

අංකය. කිව්. සී. 114.

පොදු කටයුත්තක් සඳහා පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1954රේ අංක 39 දරණ ඉඩම් රජය සන්තක කිරීමේ (සංශෝධිත) ආඥාපණතින් සංශෝධිත වූ, 1950හේ අංක 9 දරණ ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

මූලික සැලැස්ම අංකය : ඒ. 4738 ගම : ගෝනහේන.

කොළඹ දිස්ත්‍රික්කය බටහිර සියනෑකෝරලේ (අදිකාරි පත්තුව)

කැ. අංකය : 1.

ඉඩමේ නම : ඊරියගහකුඹුර ; විස්තරය : වගා නැති පොල් ඉඩමක කොටසක් සහ කුඹුරු සහ ඇලේ කොටසක් ; අයිතිකරුගේ නම සහ ලිපිනය : ඇම්. ජේ. ඇම්. මනුවෙල් ජයවර්ධන, ගෝනහේන ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 16.13.

කැ. අංකය : 2.

ඉඩමේ නම : මීල්ලගහකුඹුර හෙවත් මහ කුඹුර ; විස්තරය : කුඹුර ; අයිතිකරුගේ නම සහ ලිපිනය : ආර්. ඒ. ආනාජෝසපින් පෙරේරා මහත්මී, ජී. ඒ. වික්‍රමසිංහ බාරේ, බැම්මිණිවත්ත, මාවතැල්ල ; ප්‍රමාණය : අ. 0, රූ. 0, ප. 24.53.

එකතුව අ. 0, රූ. 1, ප. 00.66.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 සැප්තැම්බර් මස 8 වැනි දින පූ. භා. 10.30 ට කොළඹ, කච්චේරියේදී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අගෝස්තු මස 25 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

ඩී. රාජරත්නම්,
කොළඹ දිස්ත්‍රික්කයේ ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි තැන.

1962 ජූලි මස 14 වැනි දින,
කොළඹ කච්චේරිය.

7-825 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

## ඉඩම් ලබාගැනීමේ ආඥාපනත (460 වෙනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

ඇල්. එච්./බී. 240

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩම්වල විස්තර :—

බස්නාහිර පලාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පාණදුර තොටමුණේ පාණදුර නගර සභා සීමාව තුළ වෝඩ් නොම්මර 2 දරණ උතුරු පට්ටිය (ඒ), පට්ටිය උතුර ගමේ පිහිටි කුරුඳුවත්ත වලව්වත්ත නැමැති ඉඩම්.

වැඩි විස්තර වශයෙන් මු. සැ. නො. ඒ. 4,771 කැ. නො. 1 සහ 2.

කැබලි නො. 1.

ඉඩමේ නම : කුරුඳුවත්ත 4 වන හරස් පාරේ වරිපනම් අංක 15 හා 17න් කොටසක් ; ඉඩම පිළිබඳ විස්තර : අවුරුදු 50 ක් වයසැති පොල් ගස් 28 යි, අවුරුදු 25 ක් වයසැති දෙල් ගස් 1 යි, අවුරුදු 25 ක් වයසැති අඹගස් 2 යි, අවුරුදු 5 ක් වයසැති මාරගස් 1 යි, අවුරුදු 10ක් වයසැති ඇඹරැල්ල ගස් 1 යි, ගලෙන් බඳින ලද ලිඳකින් කොටසක්, සථිර වැසිකිලියක්, සථිර නිවාසයකින් කොටසක්, බැම්මෙන් කොටසක්, සිමෙන්තියෙන් බඳින ලද කානු ; අයිතිකරුවෝ : එෆ්. එල්. සිරිමාන්න, නො. 6, කොතලාවල පෙදෙස, කොළඹ 4 ; ප්‍රමාණය : අ. 0, රූ. 1, ප. 30.00.

කැබලි නො. 2.

ඉඩමේ නම : කුරුඳුවත්ත වලව්වත්ත, 4 වැනි හරස් පාරේ වරිපනම් අංක 15 හා 17න් කොටසක් ; ඉඩම පිළිබඳ විස්තර : අවුරුදු 50ක් වයසැති පොල් ගස් 40 යි. අවුරුදු 25ක් වයසැති දෙල් ගස් 2 යි. අවුරුදු 25ක් වයසැති අඹගස් 1 යි. අවුරුදු 5 ක් වයසැති මාර ගස් 1 යි. බඳින ලද ලිඳක්. බඳින ලද ලිඳකින් කොටසක්. ස්ථිර ගොඩනැගිලි 2 ක්. (ගරාජය සහ වැසිකිලිය) ස්ථිර නිවාසයෙන් කොටසක්. සහ සිමෙන්තියෙන් බඳින ලද කානු ; අයිතිකරුවෝ : එෆ්. බී. සිරිමාන්න, " බෙතල් " කටුකැලේ, මහනුවර ; ප්‍රමාණය : අ. 0, රූ. 2, ප. 20.

එකතුව : අ. 1, රූ. 0, ප. 10.

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 සැප්තැම්බර් මස 7 වැනි දින පූ. භා. 9.30ට පාණදුර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අගෝස්තු මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම් ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

පී. ජී. පුංචිහේවා,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 ජුලි මස 18 වැනි දින,
කළුතර කච්චේරිය.

7-866 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් ලබාගැනීමේ ආඥාපණත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ වූ දැන්වීමයි

අංකය : ඇල් ඩී/ඊ/54.

පොදු කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් ලබාගැනීමේ ආඥාපණතේ 7 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්කර :—

මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මැදසිය පත්තුවේ වල්ගම පිහිටි ප්‍රමාණයෙන් අ. 29, රූ. 2, ප. 15 ක් වූ ඒ 2938 දරන මූලික පිඹුරේ අංක 1 හා 2 යනුවෙන් මැන විස්තර කරනලද දැනට අම්බලන්ගොඩ, පෝරඹ ජේ. ඇම්. පී. ද සිල්වා මයි., ආර්. ඇම්. ජේ. ද සිල්වා මයි., සහ සී. ඇම්. ද වාස් මයි., අයිතිකම් කියනු ලබන ලියන්ගහමුදුනේ වත්ත නමැති ඉඩම සහ ඇල.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 1962 අගෝස්තු මස 27 වැනි දින පූ. භා. 10 ට මහනුවර කච්චේරියේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 1962 අගෝස්තු මස 20 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල සවභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි. තවද ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම් තහවුරු කර ගැනීම පිණිස සහ එකී ඉඩම ගැන ඔවුන් විසින් ඉල්ලනු ලබන වන්දි මුදල් ප්‍රමාණය සම්බන්ධවද ඇති ඔප්පු සහ ලියකියවිලිද මේ කරුණ සම්බන්ධව පවත්වන විභාගයේදී ඉදිරිපත් කළ යුතුයි.

සී. එච්. ප්‍රේමවර්ධන,
ආණ්ඩුවේ උප ඒජන්තතැන.

1962 ජූලි මස 18 වැනි දින,
මහනුවර කච්චේරිය.

7-909 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ (460 වැනි පරිච්ඡේදයේ) 33 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

රත්නපුර දිස්ත්‍රික්කයේ උප දිසාපති වන මොහමඩ් අකීල් මොහමඩ් වන මවිසින් ඉඩම් අත්කර ගැනීමේ ආඥාපනතේ (460 වැනි පරිච්ඡේදයේ) 33 වැනි වගන්තිය යටතේ දන්වන වගනම් පහත සඳහන් උප ලේඛනයේ විස්තර වන ඉඩම් සඳහා ඊට අයත් වන්දි හා පොලී වශයෙන් පහත සඳහන් මුදල් එම නඩුවල අයට තැන්පත් කර ඇති බවද, ඊට අයිතිවාසිකම් කියන අය විසින් එය ලබාගන්නා ලෙස මෙයින් දන්වමි.

දිසාපති කාර්යාලය,
රත්නපුර, ජූලි 18, 1962.

ඇම්. ඒ. මොහමඩ්,
උප දිසාපති.

### උපලේඛනය

| ඉඩමේ විස්තර | ප්‍රමාණය රු. ශ. | | නඩු අංකය |
|---|---|---|---|
| (1) රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත සහ මැද කෝරළයේ, මැද කෝරළයේ හෙලඋඩ පළාතේ බලංගොඩ නගර සභා සීමාව තුල අංක 6 දරණ කොට්ඨාශයේ, දෙරවෙලගමේ (කොටසක) පිහිටි හපුතලේ පාරේ වරිපනම් අංක 14/2 හා අංක ඒ 950 දරණ මූලික සිතියමේ ලොට් 2 වශයෙන් පෙන්වන මැදගොඩැල්ල නමැති ඉඩම | 632 34 | ... | රත්නපුර දිස්ත්‍රික් උසාවියේ අංක 104 දරන නඩුව |
| (2) රත්නපුර දිස්ත්‍රික්කයේ කඩවත සහ මැද කෝරළේ, මැද කෝරළේ හෙලඋඩ පළාතේ බලංගොඩ නගර සභා සීමාව තුළ අංක 4 දරන කඩ වීදිය කොට්ඨාශයේ දෙරවෙලගමේ (කොටසක) පිහිටි අංක 481 දරන අ.ග.සි. 1 වැනි අතිරේකයේ ලොට් 18 වශයෙන් පෙන්වන මැදගොඩැල්ල නමැති ඉඩම | 549 15 | ... | රත්නපුර දිස්ත්‍රික් උසාවියේ අංක 103 දරන නඩුව |
| (3) රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත සහ මැද කෝරළේ, මැද කෝරලේ, හෙලඋඩ පළාතේ, බලංගොඩ නගර සභා සීමාව තුල අංක 4 දරණ කඩවීදිය කොට්ඨාශයේ දෙරවෙල ගමේ (කොටසක) පිහිටි අංක 481 දරණ අ.ග.සි. 1 වැනි අතිරේකයේ ලොට් 16 වශයෙන් පෙන්වන මැද ගොඩැල්ල නැමැති ඉඩම | 366 10 | ... | රත්නපුර දිස්ත්‍රික්ක උසාවියේ අංක 102 දරණ නඩුව |
| (4) රත්නපුර දිස්ත්‍රික්කයේ, කඩවත සහ මැද කෝරළේ, මැද කෝරළේ, හෙලඋඩ පළාතේ, බලංගොඩ නගර සභාව සීමාව තුල අංක 4 දරන කඩවීදිය කොට්ඨාශයේ දෙරවෙලගමේ (කොටසක) පිහිටි අංක 481 දරණ අ.ග.සි. 1 වැනි අතිරේකයේ ලොට් 13 සහ 14 වශයෙන් පෙන්වන මැද ගොඩැල්ල නමැති ඉඩමෙන් 224/3283න් පංගුවක් | 235 28 | ... | රත්නපුර රික්වෙස්ට් උසාවියේ අංක 78/දරණ නඩුව |

7-853 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

# ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ දැන්වීම්

අංකය : එල් ඊ/ඒ/188.

මෙහි පහත උපලේඛනයේ විස්තර දක්වෙන ආණ්ඩුවේ ඉඩම් බෙදාදීම පිණිස අඩු වශයෙන් පසුගිය දස වසිය තුළ නොකඩවා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පදිංචිව සිටි අයගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. පහත දක්වෙන පෝර්මයේ පිළිවෙලට එවන ඉල්ලුම් පත්‍ර 1962 අගෝස්තු මස 18 වෙනි දින දක්වා හම්බන්තොට දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා විසින් භාරගනු ලැබේ. මුද්‍රිත ඉල්ලුම් පත්‍ර මේ සඳහා නො දෙන බව ඉල්ලුම්කරුවන් විසින් දැනගත යුතුයි.

3. ඉඩම් ලැබීමට සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම පිණිස 1962 අගෝස්තු මස 27 දින පෙ. ව. 9ට හම්බන්තොට කච්චේරියේදී ඉඩම් කච්චේරිය පවත්වනු ලැබේ. ඉඩම් කච්චේරිය සඳහා ලැබෙන අයදුම් පත් ගණන ගැන සලකා බලා සියලුම අයදුම් කරුවන් එම දිනයේ දීම සම්මුඛ පරීක්ෂණයට භාජන කිරීම අසීරු බව වැටහී ගියහොත් අයදුම් කරුවන්ගෙන් කොටසකට වෙනත් දිනයකදී ඒ සඳහා ඉදිරිපත් වන ලෙස ලියා දන්වනු ඇත. වෙනත් දිනයකදී මේ සඳහා ඉදිරිපත් වන ලෙස දන්වා ලිපියක් නොලබන සියලුම අයදුම්කරුවන් ඉහත සඳහන් දින පැවැත්වෙන ඉඩම් කච්චේරියට ඉදිරිපත් විය යුතුය. නැතහොත් තමා වෙනුවෙන් ලිපියකින් බලය දුන් නියෝජිතයෙක් එවිය යුතුය. ඉල්ලුම්කරු හෝ තමා විසින් බලය දුන් නියෝජිතයෙකු හෝ ඉඩම් කච්චේරියට නොපැමිණි විට ඉල්ලුම්කරුට ඉඩම් අනවශ්‍ය බව සලකා ඔවුන්ගේ ඉල්ලුම් පත් ගැන සලකා බැලීම අත්හිටවනු ලැබේ.

4. තමා තෝරාගත් බව දැන්වූ වහාම සෑම ඉල්ලුම්කරුවෙක්ම තමාට වෙන්කරන්ට යන ප්‍රමාණයේ හැටියට අක්කරයකට රු. 5 බැගින් තැන්පත් මුදලක් තැන්පත් කළ යුතුයි. ඉල්ලුම්කරුගේ යම් ක්‍රියා වක් හෝ වරදක් නිසා ඉඩම මැනීමෙන් ආණ්ඩුවට යම් අනවශ්‍ය මැනුම් වියදමක් දරන්ට සිදුවුනි නම් මේ තැන්පත් මුදල් ආපසු දෙනු නොලැබේ. මේ තැන්පත් මුදල ආපසුදීම හෝ නොදීම පිළිබඳ ඉඩම් කොමසාරිස්තුමාගේ තීරණය අවසාන තීරණය වේ.

5. මධ්‍යම පන්තියට අයත් ලාංකිකයින්ගේ ඉල්ලුම් පත් පමණක් සලකා බලනු ඇත. මේ ඉඩම් කච්චේරිය සඳහා මධ්‍යම පන්තියට අයත් ලාංකිකයන් වශයෙන් ගැණෙන්නේ පහත සඳහන් සුදුසුකම් ඇති අය පමණකි. අවිවාහක නම් වාර්ෂික ආදායම රු. 12,000 කට වැඩි නොවන හෝ විවාහක නම් දෙදෙනාගේ වාර්ෂික ආදායම රු. 24,000කට වැඩි නොවිය යුතුයි.

6. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අන්තිම අවුරුදු තුනේ (3) තක්සේරු වාර්තා ඉඩම් කච්චේරියේදී හෝ එය උවමනා විටෙක ඉදිරි පත් කළ යුතුය. නොඑසේ නම් තමාගේ ආදායම පිළිබඳව හෝ තමා ළඟ ඇති මුදල් පිළිබඳව සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

7. ඉඩම් සශ්‍රීක කිරීම සඳහා මුල් අවුරුදු හය (6) තුළ අවුරුදු පතා වියදම් කළ හැකි මුදල කෙතෙක් දැයි සම්මුඛ පරීක්ෂණයට පැමිණෙන අයදුම්කරුවන් විසින් සාක්ෂි ඇතුව ප්‍රකාශ කළ යුතුය.

8. තෝරාගත් ඉල්ලුම්කරුවන්ට ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ භුක්තිය භාරදෙනු ලැබේ. වාර්ෂික මුළු මුදල අයකරන්නේ ඉඩම්වල නොදියුණු වටිනාකමින් සියයට හතර බැගිනි.

9. තෝරාගත් ඉල්ලුම්කරුවන් විසින් අනුමත කරන ලද වැඩ පිළිවෙලක් අනුව ඉඩම්වල කප්පු වගාකළ යුතුයි. හම්බන්තොට දිසාපති තුමාගෙන් ප්‍රථමයෙන් ලබාගත් ලිඛිත අවසරයක් නොමැතිව ඉඩමේ වෙන කිසියම් වගාවක් නොකළ යුතුයි.

### ඉඩම්වල විස්තර

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මාගම් පත්තුවේ පිහිටි—

හම්බන්තොට ගොන්නොරුව පාරේ පිහිටි කප්පු මධ්‍යස්ථානයට සහ කැලිගම මන්කඩට අතර බටහිර ප්‍රදේශයේ පිහිටි ටෝපෝ 4 ලොට් 243 දරණ ඉඩම්.

හම්බන්තොට-ගොන්නොරුව පාරේ නැගෙනහිර ප්‍රදේශයේ කැලිගම හන්දිය සහ බදගිරිය පාරටත් අතරේ සැතපුම් භාගයක පළල පිහිටි ටෝපෝ 4 ලොට් 243 දරණ ඉඩම්.

හම්බන්තොට-ගොන්නොරුව පාරේ බටහිර ප්‍රදේශයේ කැලිගම හන්දියටත් ගොන්නොරුව හන්දියටත් අතර පිහිටි ටෝපෝ 4 ලොට් 243 දරණ ඉඩම්.

ජී. පී. එච්. එල්. සිල්වා,
හම්බන්තොට දිසාපති වෙනුවට.

1962 ජූලි මස 21 දින,
හම්බන්තොට දිසාපති කාර්යාලයේදීය.

### හම්බන්තොට දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් කැබැල්ලක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය

(1) නම හා ලිපිනය :————.

(2) වයස :————.

(3) විවාහකද ? :————.

(4) විවාහක නම් ළමුන්ගේ ගණන හා වයස් :————.
අවිවාහක නම් තමන්ට සිටින වෙනත් යැපෙන්නන් සහ ඔවුන්ට ඇති නෑකම් :————.

(5) භාර්යාව/ස්වාමි පුරුෂයා ජීවත්ව සිටීද ? :————.

(6) (අ) ආදායම් බදු දෙපාර්තමේන්තුවේ පසුගිය අවුරුදු තුණේ (3) තක්සේරුව අනුව වාර්ෂික ආදායම (ආදායම සහ අවුරුද්ද සඳහන් කළ යුතුයි) :————.
(ආ) භාර්යාවගේ/ස්වාමි පුරුෂයාගේ පසුගිය අවුරුදු තුණේ (3) වාර්ෂික ආදායම වෙනම තක්සේරු කළා නම් එයේ සඳහන් කරන්න :————.

(7) ඉඩම් සශ්‍රීක කිරීමේ ආඥපනත යටතේ හෝ බදු ක්‍රමය යටතේ හෝ ආණ්ඩුවෙන් ලැබී ඇති ඉඩම් සහ පෞද්ගලික ඉඩම්වල විස්තර (ඉඩම් පිහිටි තැන් සහ වවා ඇති වැවිලිවල විස්තර සඳහන් කරන්න) :————.
(අ) ඉල්ලුම්කරු : ගොඩ ඉඩම් :——, මඩ ඉඩම් :——.
(ආ) භාර්යාව/ස්වාමි පුරුෂයා : ගොඩ ඉඩම් :——, මඩ ඉඩම් :——.
(ඇ) ඉල්ලුම්කරුගේ දෙමව්පියන් : ගොඩ ඉඩම් :——, මඩ ඉඩම් :——.
(ඈ) භාර්යාවගේ/ස්වාමි පුරුෂයාගේ දෙමාපියන් : ගොඩ ඉඩම් :——, මඩ ඉඩම් :——.

(8) තමාට ලැබෙතැයි බලාපොරොත්තු විය හැකි ඉඩම් සම්බන්ධ විස්තර :————.
(අ) ඉල්ලුම්කරුට : ගොඩ ඉඩම් :——, මඩ ඉඩම් :——.
(ආ) භාර්යාවට/ස්වාමි පුරුෂයාට : ගොඩ ඉඩම් :——, මඩ ඉඩම් :——.

(9) සශ්‍රීක කිරීම සඳහා ඇති මුල් මුදල :————.

(10) සශ්‍රීක කිරීම සඳහා අවුරුදු පතා ඉල්ලුම්කරුට වියදම් කළ හැකි මුදල :————.

(11) වෙනත් කරුණු :————.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

7-1022 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

5/1/20/1734.

## දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම පිළිබඳ ඉඩම් කච්චේරියේ දැන්වීමයි

කෑගලු දිසාවේ, වැලිගමුව, පුවක්මොටේ, දිඹුල්ගමුව, වලල්ගොඩ, හේවාදිවල, යටගම සහ කිවුල්පනේ නමැති ගම

මෙහි පහත විස්තර දක්වෙන රජයේ ඉඩම් දීම සඳහා දීමනා පත්‍ර ලැබීමට සුදුස්සන් තෝරා ගැනීම පිණිස වර්ෂ 1962 අගෝස්තු 30 වැනි දින පෙරවරු 9ට කෑගල්ලේ කච්චේරියේ දී, ඉඩම් කච්චේරියක්, ඉඩම් සංවර්ධන ආඥපනත යටතේ කෑගලු දිසාවේ රජයේ දිසාපති විසින් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. දීමනාපත්‍ර දෙනු ලබන්නේ ඉහතකී ආඥපනතේ පළමුවැනි උපලේඛනයෙහි සඳහන් කරුණුවලට අනුකූලවයි.

3. දීමනාපත්‍ර ඉල්ලුම් කරන අය ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනී සිටීමට නියෝජිතයෙකු එවිය යුතුය.

4. මෙම ඉඩම් කච්චේරිය පිළිබඳ වැඩිදුර කරුණු කෑගලු දිසාවේ රජයේ දිසාපතිගෙන් දැන ගත හැක.

ඩබ්ලිව්. එච්. ජයසිංහ,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

1962.7.14 වැනි දින,
කොළඹදීය.

## ඉහත සඳහන් ඉඩම්වල විස්තරය

| ගම | සැලැස්ම අංක | | කට්ටි අංක | නම | ප්‍රමාණය අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|---|
| ඒ/1—වැලිගමුව | අ.ග.සි. | 98 | 88 | කේ. ඩබ්ලිව්. ඇම්. මර්තේලිස් අප්පුහාමි | 0 | 3 | 09 |
| ඒ/18—පුවක්මොටෙ | අ.ග.සි. | 150 | 123 | සේතුන් මුදියන්සෙලාගේ නිකලස් අප්පුහාමි | 0 | 3 | 15 |
| ඩී/16—දිඹුල්ගමුව | පී.පී.ඒ. | 352 | 81 | කොච්චුන්නේ වියන්නලාගේ ලපයා | 0 | 2 | 39 |
| ඒ7/11—වලල්ගොඩ | අ.ග.සි. | 102 | 55 | සිප්කඩුතුඩුගේ ජෝන් සිල්වා | 0 | 3 | 33 |
| ඒ11/66—හේවාදිවල | අ.ග.සි. | 127 | ¶45 | රාජපක්ෂපේඩිගේ ජේමිස් | 0 | 3 | 32 |
| ඒ15/4—යටගම | අ.ග.සි. | 153 | 122 | මේරගල් පේඩිගේ එලිසා | 0 | 3 | 16 |
| ඒ15/44—යටගම | අ.ග.සි. | 153 | 83 | දේවින්දර ගෙදර විජේන්ද්‍ර නයිදේ | 1 | 0 | 02 |
| ඒ71/7—කිවුල්පනේ | පී.පී.ඒ. | 1091 | 1 සහ 6 | හොරකල් පේඩිගේ රනා | 2 | 0 | 05 |

7-803 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් කච්චේරි දැන්වීම

පහත ලේඛනයේ විස්තර සඳහන් ඉඩම් සම්බන්ධයෙන් මඩකලපු දිස්ත්‍රික්කයේ උතුරු මන්මුනායි ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොටසෙහි ස්ථිර පදිංචි කරුවන්ගෙන් අක්කර 5යේ ඉඩම් කට්ටි සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පහත සඳහන් ෆෝර්මයේ දැක්වෙන පිළිවෙලට එවන ඉල්ලුම් පත් 1962.8.28 වෙනි දිනට හෝ ඊට ප්‍රථමයෙන්, මඩකලපු දිස්ත්‍රික්කයේ දිසාපතිට ලැබෙන ලෙසට එවිය යුතුය. මුද්‍රිත ඉල්ලුම් පත් මේ සඳහා නොදෙන බව ඉල්ලුම්කරුවන් දැන ගත යුතුයි.

3. ඉඩම් ලබා ගැනීම පිණිස සුදුසු අයදුම්කරුවන් තෝරා ගනු වස්, 1962කෝ සැප්තැම්බර් මස 19 වෙනි දින පෙරවරු 9ට මඩකලපු දිසාපති කාර්යාලයේදී ඉඩම් කච්චේරිය පවත්වනු ලැබේ. ඉඩම් කට්ටි ලබා ගැනීමට කැමති සෑම අයදුම්කරුවෙක්ම ඉඩම් කච්චේරියට පුද්ගලිකව පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් ලිපියකින් බලය දුන් නියෝජිතයෙක් එවිය යුතුය. අයදුම්කරු හෝ තමා විසින් බලය දුන් නියෝජිතයෙකු ඉඩම් කච්චේරියට නො පැමිණියේ නම්, මඩකලපු දිසාපති විසින් අයදුම්කරු ඉල්ලුම් පත සම්බන්ධයෙන් වැඩි දුරටත් කටයුතු නො කරන්නේ යයි, සලකනු ලැබේ.

4. තමා තෝරා ගත් බව දැන්වූ වහාම සෑම අයදුම්කරුවෙක්ම නමාට වෙන් කරන්නට යන ප්‍රමාණයේ හැටියට අක්කරයකට රු. 3 බැගින් මුදලක් තැන්පත් කළ යුතුය. අයදුම්කරුගේ යම් වරදක් නිසා ආණ්ඩුවට අනවශ්‍ය වියදමක දරන්ට සිදුවුනි නම්, තැන්පත් කළ මුදල ආපසු දෙනු නො ලැබේ. මේ කාරණය සම්බන්ධයෙන් ඉඩම් කොමසාරිස්ගේ තීරණය අවසාන තීරණය වේ.

5. ප්‍රදේශයේ අවුරුදු 10 කට වැඩි ස්ථිර පදිංචිව සිටි, මධ්‍යම පංතියට අයත් ලාංකිකයන්ගේ ඉල්ලුම් පත් පමණක් සලකා බලනු ලැබේ. මෙම ඉඩම් කච්චේරිය සඳහා මධ්‍යම පන්තියට අයත් ලාංකිකයන් වශයෙන් හඳුන්වනු ලබන්නේ පහත සඳහන් අය පමණකි :—

"වර්ෂයට රු. 3000ත් රු. 10,000ත් අතර ආදායමක් ලබන කෙනෙකු හෝ විවාහක අයදුම්කරුවෙක් නම් භාර්යාවගේ සහ පුරුෂයාගේ ඒකාබද්ධ ආදායම රු. 6,000 රු. 20,000ත් අතර විය යුතුයි."

6. ඔහුගේ/ඇගේ ආදායම ඉඩම් කච්චේරියේදී හෝ උවමනා කළ විටක සාක්ෂි ඇතිව ඔප්පු කළ යුතුය.

7. තෝරා ගත් අයදුම්කරුවනට ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ භුක්තිය භාරදෙනු ලැබේ. වාර්ෂික බදු මුදල අයකරනු ලබන්නේ ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 4 (4%) බැගිනි.

8. ඉඩම කජු වගා කිරීමට සුදුසු යයි රපෝර්තු කර තිබේ. තෝරා ගත් අයදුම්කරුවන් අනුමත සංවර්ධන පිලිවෙලක් අනුව, ඉඩමේ කජු වගා කළ යුතු වේ.

9. වැඩි විස්තර මඩකලපු දිසාපති ගෙන් ලබා ගත හැකිය.

ඒ. ඇස්. කුණසිංහම්,
මඩකලපු දිසාපති වෙනුවට.

දිසාපති කාර්යාලය,
මඩකලපුව, 62. 7. 20.

## ඉඩම්වල ලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රා.ආ.නි.කොටස | ගම | ප්‍රමාණය | වගාකළයුතු වැවිල්ල |
|---|---|---|---|---|
| මඩකලපුව | උතුරු මන්මුනායි | පුදුකුඩිඉරිප්පු | අක්කර 80 | කජු |
| එම | එම | නාවලඩි | අක්කර 20 | එම |

**මඩකලපු දිස්ත්‍රික්කයේ රජයේ ඉඩම් කැබැල්ලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයකි**

1. නම සහ ලිපිනය :————.
2. වයස :————.
3. විවාහකද :————.
4. විවාහක නම් ළමුන් ගණන සහ වයස :————.
5. භාර්යාව ස්වාමි පුරුෂයා ජීවත්ව සිටීද :————.
6. අයදුම්කරුගේ ආදායම :————.
7. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ හෝ බදු ක්‍රමය යටතේ හෝ ආණ්ඩුවෙන් ලැබී ඇති ඉඩම් සහ පුද්ගලික ඉඩම් වල ප්‍රමාණය, ඉඩම් පිහිටි තැන් සහ වගාකළ ඇති වාණිජ වැවිලි වල විස්තර සඳහන් කරන්න :————.

(අ) ඉල්ලුම් කරු විසින්

| ගොඩ ඉඩම | | | මඩ ඉඩම | | |
|---|---|---|---|---|---|
| අ. | රූ. | ප. | අ. | රූ. | ප. |

(ආ) භාර්යාව/පුරුෂයා විසින්

| ගොඩ ඉඩම | | | මඩ ඉඩම | | |
|---|---|---|---|---|---|
| අ. | රූ. | ප. | අ. | රූ. | ප. |

8. ඉල්ලුම්කරු ගේ දෙමව්පියන් සතු ඉඩම් ප්‍රමාණය සහ එහි වැවිලි වල විස්තර :————.
9. භාර්යාවගේ/පුරුෂයාගේ දෙමව්පියන් සතු ඉඩම් ප්‍රමාණය : ————.
10. සශ්‍රීක කිරීම සඳහා අවුරුදු පතා ඉල්ලුම්කරුට වියදම් කළ හැකි මුදල :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

7-986 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

# ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

## අනුරාධපුර නව නගරයේ සහ ඒ අවට නිවාස සෑදීම සඳහා ඉඩම් කොටස් බදුදීම

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති විසින් නව අනුරාධපුරයේ නිවාස සාදාගැනීම සඳහා ඉඩම් කොටස් බදුදීම පිණිස මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. ඉඩම් බදුදීම සඳහා සුදුස්සන් තෝරීමේදී පහත සඳහන් ප්‍රමුඛත්වය පිළිපදිනු ලැබේ :—

(අ) (i) රජයට ගත්තා ලද හෝ ගනු ලබන 1956 ට පෙර සිට නොකඩවා පදිංචියක් ඇති ඉඩම් හෝ පදිංචි ස්ථාන හිමිකරුවන් (ඉඩම් අයිතිකරු එහි පදිංචි නැත්නම්, ඉඩම් දෙනු ලබනුයේ, එසේ අළුතෙන් දෙනු ලබන ඉඩමේ ගෙය සෑදූවිට බදුකරුටම එම ගෙය තක්සේරු බද්දකට බදුදෙන බවට පොරොන්දු වෙතොත් පමණි).

(ii) ඉහතින් දැක්වූ (i) වෙනි වගන්තියේ සඳහන් ස්ථාන වල 1956 සිට නොකඩවා පදිංචියක් ඇති බදුකරුවන්ට (මේ අයට ඉඩම් ලැබෙන්නේ ඔවුන් සිටින ඉඩම්වල අයිතිකරුවන්ට ඒ සඳහා වෙනත් ඉඩම් නොලැබී තිබුණොත් පමණි).

(ආ) 1956 ට පෙර සිට අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය යටතට ගෙන ඇති ප්‍රදේශයේ පදිංචියක් ඇති ඉඩම් අයිතිකරුවන්ට,

(ඇ) අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලය යටතට ගෙන ඇති ප්‍රදේශයේ අවුරුදු 10 කට වැඩි ස්ථිර පදිංචියක් ඇති අය.

(ඈ) අනෙක් අයදුම්කරුවන්.—එනම්, දැනට අනුරාධපුරයේ පදිංචිව නොසිටින අය.

සැ. යු.—අනුරාධපුරයේ නව නගරයෙන් දැනට ඉඩම් නැතිලත් ලාංකිකයන්ට පමණක් ඉඩම් දෙනු ලැබේ. එක් අයෙකුට එක ඉඩම් කැබැල්ලකට වඩා දෙනු නොලැබේ.

3. පහත සඳහන් ඉඩම් බදුදීම සඳහා තිබේ :—

(අ) ගුවන් තොටුපල පාරේ අක්කර බාගේ කැබලි 50 යි.
(ආ) නව නගරයේ 2 වන පියවරේ පර්චස් 30 කැබලි 300 යි.

4. ඉඩම් කච්චේරිය 1962 සැප්තැම්බර් 10 සහ 11 යන දිනයන්හි උදය නවයට පටන්ගෙන පවත්වනු ලැබේ. සියළුම ඉල්ලුම්කරුවන් තමාම හෝ නීත්‍යානුකූලව අවසර දෙන ලද නියෝජිතයන්ගේ මාගීයෙන් ඉඩම් කච්චේරියේදී පෙනී සිටිය යුතුයි.

5. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවකුම වෙනත් කරුණුවලට අමතර වශයෙන්, පහත සඳහන් කරුණු අඩංගු බද්දකට යටත්විය යුතුයි :—

(අ) බද්දෙහි කාලය අවුරුදු 99 යි.

(ආ) බදුකරු ඉඩමේ නොදියුණු වටිනාකමෙන් සියයට 4 ක බද්දක් අවුරුදු පතා ගෙවිය යුතුයි.

(ඇ) බදුකරු තමාගේ වියදමෙන් බද්ද පටන්ගත් දිනයේ සිට අවුරුද්දක් ඇතුලත මා විසින් අනුමත කළ සැලැස්මකට අනුව නිවාසයක් සෑදිය යුතුයි.

(ඈ) බදුකරු බද්ද පටන්ගත් දිනයේ සිට මාස 6 ක් ඇතුලත ඉඩමේ නිවාසයක් සෑදීමේ වැඩ ආරම්භ කළ යුතුයි.

(ඉ) බදුකරු ඉඩම පදිංචිය සඳහා හැර වෙනත් කටයුත්තක් සඳහා නොයෙදිය යුතුයි.

(ඊ) බදුකරු අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපතිගෙන් කලින් ලබාගත්, අවසරයක් නොමැතිව ඉඩමේ ගොඩනැගිලි එකකට වඩා ඉදි නොකළ යුතුයි.

6. මෙහි පහතින් දක්වා ඇති පෝර්මයේ පරිදි සකස් කරන ලද ඉල්ලුම් පත්‍රය "අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති, නගර ශාලාව, අනුරාධපුර" කියා එවිය යුතුයි. සියළුම ඉල්ලුම් පත්‍ර 1962 අගෝස්තු 27 වන දින හෝ ඊට පෙර මෙම කාර්යාලයට එවිය යුතුයි.

7. ඉඩම් දීම පිළිබඳ හෝ වෙනයම් කරුණක් ගැන වැඩිදුර විස්තර අනුරාධපුර නගර ශාලාවේ පිහිටි සංරක්ෂණ මණ්ඩල කාර්යාලයෙන් ලබාගැනීමට පුලුවන.

නිශ්ශංක විජයරත්න,
අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සභාපති.

1962 ජූලි මස 16 වන දින,
අනුරාධපුර නගර ශාලාවේ දී ය.

### ආදර්ශ පෝර්මය

**අනුරාධපුර නව නගරයෙන් නිවාසයක් සඳහා ඉඩමක් ඉල්ලීම**

I

(1) සම්පූර්ණ නම :————.
(2) ලිපිනය :————.
(3) ජාතිය හා උපන් ස්ථානය :————.
(4) (අ) විවාහකද යන බව :————.
(ආ) පවුලේ සිටින ගණන :————.
(5) රක්ෂාව :————.
(6) වාර්ෂික ආදායම :————.

II

(7) ඔබට අනුරාධපුර නව නගරයෙන් නිවාසයක් සඳහා ඉඩමක් ලැබී තිබේ ද ? :————.
(8) ඔබ අනුරාධපුර සංරක්ෂණ ක්‍රමය යටතේ රජයට ගනු ලැබූ හෝ ගනු ලබන ඉඩමක අයිතිකරුද නැතහොත් බදුකරුද ? (විස්තර සපයන්න) :————.
(9) ඔබට ඉහත සඳහන් (8 වන කොටසේ සඳහන් ඉඩම් හැර) සංරක්ෂණ පෙදෙසේ වෙනත් ඉඩම් අයිතිද ? විස්තර සපයන්න :————.
(10) අනුරාධපුර පදිංචි කාලසීමාව :————.
(11) ස්ථිර පදිංචිය ඇති ස්ථානය :————.
(12) කුමන ඡේදයක් යටතේ ඔබ ඉඩමක් ලැබීමට සුදුසුද ? (ගැසට් නිවේදනයේ දෙවන ඡේදය බලන්න) :————.
(13) සෑදීමට අදහස් කරණ නිවාසයේ වටිනාකම :————.
(14) ඔබ ඔබේ මුදලින් ගෙය සෑදීමට අදහස් කරන්නේ ද නැත හොත් ජාතික නිවාස දෙපාර්තමේන්තුවෙන් ණයක් ලබා ගෙන එය සෑදීමට අදහස් කරන්නේ ද ? :————.
(15) නිවාසය සඳහා ඔබට වියදම් කළ හැකි ප්‍රමාණය :————.
(16) වෙනත් විස්තර :————.

අත්සන :————.

දිනය :————.

7-960 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

එල්.එම්./1315.
ආර්.ආර්./366.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ තම්පලාකාමම් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ පිහිටි, ඇලන්කර්නි ගමේ වී. සරවනමුත්තු මහතාට ඉඩම් සංවර්ධන ආඥාපණත යටතේ අංක 225ඒ/32 දරණ බලපත්‍රයෙන් පවරා දී තිබුනු ඉඩමෙන්, ප්‍රමාණයෙන් අක්කර 1/2 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක්, ගබඩාවක්, කායකීලයක් හා වෙළඳ සැලක් ගොඩනැංවීම සඳහා ඇලන්කර්නි විවිධ සේවා සමුපකාර සමිතිය බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කටයුත්ත සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලට ද යටත් කොට ඉඩම් බදු දීමට රජය අදහස් කොට තිබේ :—

(අ) කාලය : අවුරුදු 30 යි.

(ආ) බද්ද : අවුරුද්දට රුපියල් 1 යි.

(ඇ) බදුගන්නා විසින් බද්ද ඇරඹුණු දින සිට අවුරුද්දක් ඇතුළත දී ත්‍රිකුණාමලයේ දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි ගබඩාවක්, කායකීලයක් හා වෙළඳ සැලක් තනා නිම කළ යුතුයි.

(ඈ) බදු ගන්නා විසින් මෙම ඉඩම ගබඩාවක්, කායකීලයක් හා වෙළඳ සැලක් තැනීම පිණිස මිස වෙන කටයුත්තකට නොයෙදවිය යුතුය.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුළත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළ හොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

වර්ෂ 1962 ක්වූ ජූලි මස 27 වෙනි දින,
කොළඹ,
ඉඩම් කොමසාරිස් කායකීලයේදීය,

7-969 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

අංකය: එල්. එම්. 1531.
එල්. එච්. /එල්. 472.

## 21 (2) වැනි රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වවුනියා දිස්ත්‍රික්කයේ වෙප්පන්කුලම් ගමෙහි පිහිටි පී. පී. ඇස්. 270 දරණ පිඹුරයේ 34 වැනි බිම් කැබැල්ලෙන් අක්. 1, රූ. 0, පර්. 0 ක් පමණ වූ රජයේ ඉඩම් කැබැල්ලක් සමුපකාර තොග වෙළඳ ආයතන ඩිපෝවක් ඉදිකිරීම පිණිස වවුනියා සමුපකාර තොග වෙළඳ ආයතනය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ. ඉඩමෙහි මායිම් මෙසේ ය:—

උතුරට: රජයේ ඉඩම්; දකුණට: මන්නාරම් වවුනියා ප්‍රසිද්ධ පාර; නැගෙනහිරට: රජයේ ඉඩම්; බටහිරට: ආණ්ඩුවේ වී ගබඩාව සඳහා දුන් ඉඩම.

2. ඉල්ලුම්කර ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුලුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසි වලට අමතර වශයෙන් හා පහත සඳහන් කොන්දේසිවලටද යටත්කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

(අ) කාලය: අවුරුදු 30 යි.

(ආ) බද්ද: අවුරුද්දකට රුපියල් 8, ශත. 00 යි.

(ඇ) බදු ගන්නා විසින් බද්ද ඇරඹුනු දින සිට අවුරුදු එකක් ඇතුලතදී වවුනියා දිසාපති තැනගේ සිත් ගන්නා පරිදි එකී ඉඩමෙහි සමුපකාර තොග වෙළඳ ආයතන ඩිපෝවක් තනා නිම කළ යුතුයි.

(ඇ) බදුගන්නා විසින් මෙම ඉඩම සමුපකාර තොග වෙළඳ ආයතන ඩිපෝව තැනීම පිණිස මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුයි.

3. මෙහි පහත සඳහන් දින සිට සති හයක් ඇතුලත දී මෙම ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතුන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බද්ද දෙනු ලැබේ.

වී. රාමනාදන්,
ඉඩම් කොමසාරිස් වෙනුවට.

වර්‍ෂ 1962 ක්වූ ජූලි මස 27 වෙනි දින,
කොළඹ,
ඉඩම් කොමසාරිස් කාර්‍යාලයේ දී ය.

7-968 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

එල්.බී/ඩබ්ලිව්. 675.

## මහනුවර දිස්ත්‍රික්කය, රේටියගම—කුඹුම්රිස්කැටිය නම් වූ රජයේ ඉඩමේ එනසාල් වගාවේ පලදාව භුක්තිවිඳීමේ බද්ද වෙන්දේසියේ විකිණීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රජයේ ඉඩමේ ඇති එනසාල් වගාවේ පලදාව අවුරුදු පහක කාලයකට භුක්ති විඳීමේ අයිතිය (මින්පසු දිසාපතිතුමා යයි කියැවෙන) මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමන් විසින් තෙල්දෙනියේ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්‍යාලයේදී 1962 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 9.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ බදු දෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. දිසාපතිතුමා විසින් මෙම කාරණය සඳහා බලය පවරනු ලබන ඕනෑම නිලධාරී කෙනෙකුට දිසාපතිතුමා වෙනුවෙන් වෙන්දේසිය පැවැත්විය හැක.

3. වෙන්දේසියේදී ඉල්ලීම් ඉදිරිපත් කෙරෙන්නේ වාර්ෂික බදු මුදල පිට ය. වාර්ෂික බදු මුදල සඳහා මූලික වශයෙන් තබන ලංසුව වන රු. 125.00 ට අඩු කිසිම ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

4. සෑම ඉල්ලීමක්ම භාරගැනීමට පෙර, එම ඉල්ලීමේ සත්‍ය භාවය හා ඒ ඉල්ලුම්කරුට බද්දෙහි සඳහන් කරනු ලබන කොන්දේසි පිළිපැදීමට ඇති හැකියාවත් ගැන දිසාපතිතුමන් හෙවත් වෙන්දේසිය පවත්වන නිලධාරීතැන සොයා බලනු ඇත. යම් ඉල්ලීමක් එසේ පිළිගත හැකියයි දිසාපතිතුමා හෝ ඒ නිලධාරී තැන සෑහීමට පත් නොවුවහොත්, එම ඉල්ලීම ප්‍රතික්ෂෙපකර, එවැනි ඉල්ලීමක් නොකරනලද සේ සලකා බද්ද දිගටම වෙන්දේසි කරනු ඇත.

5. වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී, සෑම ඉල්ලුම්කරුවෙකුම තමන්ම හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකු මගින් හෝ ඉහතකී වේලාවේ එම ස්ථානයේ පැමිණ සිටිය යුතුය. නියෝජිතයෙකු මගින් ඉල්ලුම් කරන සෑම අවස්ථාවකදීම, ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා මූලික ඉල්ලුම්කරු විසින් බලය පවරමින් දෙන ලද ලිපි එකී නියෝජිතයන් විසින් වෙන්දේසිය පටන් ගැනීමට පෙර පරීක්‍ෂාකර බැලීම සඳහා ඉදිරිපත් කළයුතුය.

6. ඉල්ලීම පිළිගනු ලැබූ ඉල්ලුම්කරු—

(ඒ) ඔහුගේ ඉල්ලීම භාරගත් වහා පළමුවන වර්‍ෂයේ බදු මුදල දිසාපතිතුමා හෙවත් වෙන්දේසිය පවත්වන නිලධාරීතැන වෙත ගෙවිය යුතුය.

(බී) බදු පොරොන්දු පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ 14 දිනක් ඇතුළතදී එයට අත්සන් තැබිය යුතුය.

යම් හෙයකින් ඔහු ඉහත සඳහන් (ඒ) හෝ (බී) යන්නෙක් දැක්වෙන කරුණු නොපිළිපැද්දොත් දිසාපතිතුමාට හෙවත් වෙන්දේසිය පවත්වන නිලධාරීතැනට එම වෙන්දේසිය අවලංගුකර එම ඉල්ලුම්කරු විසින් ගෙවන ලද යම් මුදලක් වේනොත් එය රාජසන්තක කළ හැක.

7. පිළිගනු ලැබූ ඉල්ලීම ඉදිරිපත් කළ අය, දිසාපතිතුමා හෝ වෙන්දේසිය පවත්වන නිලධාරීතැන නියම කළොත්, ඇප මුදලක් තැන්පත් කළයුතුය. එම ඇප මුදල මුළු බදුකාලයටම ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 10කට වැඩි නොවනු ඇත.

8. ඉල්ලුම් කරනලද මුළු මුදල ගෙවූ ඉක්බිති එම ඉල්ලුම්කරුට වෙනත් කොන්දේසි සමග පහත සඳහන් කොන්දේසිද ඇතුළත් බදු පොරොන්දු පත්‍රයක් ලබාගැනීමේ අයිතිය තිබිවේ:—

(ඒ) ඕනෑම අවස්ථාවක, මාසයක් කල් දෙමින් ලියවිල්ලක් බදුකරුට පුද්ගලිකව භාරදීමෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ අවසන්වරට දත් ලිපිනයට ලියාපදිංචිකළ තැපෑලෙන් යැවීමෙන් හෝ බද්දට අදාල ඉඩමේ පැහැදිලිව පෙනෙන ස්ථානයක අලවා තැබීමෙන් හෝ බද්ද අවලංගු කළ හැක.

(බී) බදු පොරොන්දු පත්‍රයෙන් ලැබෙන බලය බද්ද දරන්නාට පමණක් සීමාවේ.

(සී) බදුකරු බදු පොරොන්දු පත්‍රයෙහි ඒ සඳහා සඳහන්කර ඇති දිනයෙහිදී බදු මුදල ගෙවිය යුතුය.

(ඩී) බදුකරු බදු පොරොන්දු පත්‍රය මත ඔහුට ඇති හිමිකම්, අතුරු බද්දක් පිට දීම හෝ පැවරීම හෝ උගස්කිරීම හෝ වෙනත් මොනම ක්‍රමයකින් හෝ අන්සතු කිරීමක් නොකළ යුතුය.

(ඊ) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස බදුකරු ඉඩමේ ස්ථිර හෝ අර්ධ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම හෝ ස්ථිර වගාවක් ඇති කිරීම හෝ නොකළ යුතුය.

(එෆ්) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, බදුකරු ඉඩමේ වැවෙන ගස් කැපීම හෝ කැපීමට ඉඩ දීම, ඒවාට අලාභහානි කිරීම හෝ අලාභහානි කිරීමට ඉඩදීම නොකළ යුතුය.

(ජී) බදුකරු ඉඩමේ පස හෑරීම, වෙනත් ක්‍රමයකින් පස් ඉවත් කිරීම් හෝ පස ඇවිස්සීම හෝ ඉඩම හෙළිකිරීම හෝ එනසාල් පඳුරු හොඳ තත්ත්වයේ තබාගැනීම සඳහා එනසාල් පඳුරු අවට හැර ඉඩම උදළුගෑම හෝ නොකළ යුතුය.

(එච්) ඉඩම වෙනුවෙන් ගෙවියයුතු බදු, අය බදු, වරිපනම්, ආදී සියළුම වැය මුදල් බදුකරු විසින්ම ගෙවිය යුතුය.

(අයි) බදු පොරොන්දු පත්‍රයේ සඳහන් මොනම කොන්දේසියක් හෝ කඩකිරීම දිසාපතිතුමාගේ නියමයන් පිට බදු පොරොන්දු පත්‍රය වහා අවලංගු කිරීමට හේතු වනු ඇත.

(ජේ) ඉඩමට කරනලද වැඩිදියුණු කිරීම්, ඉඩම වෙනුවෙන් කරන ලද මුදල් වැය කිරීම්, අලාභ හෝ වෙනත් මොනම කරුණක් නිසා හෝ වන්දි ඉල්ලීමකට බදුකරුට කිසිම අයිතියක් නොමැත.

(කේ) මෙම බද්ද ලැබීම, පසු කාලයකදී මෙම ඉඩමේ බද්ද හෝ අයිතිය අනුග්‍රාහී ලෙස ලැබීමට බදුකරුට ලැබෙන හිමිකමක් ලෙස සැලකිය යුතු නොවේ.

සී. කේ. ඇහැලේපොල,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති.
වෙනුවට.

1962 ජූලි මස 20 වැනි දින,
මහනුවර කච්චේරියේදීය.

### උපලේඛනය

ඉඩමේ පිහිටීම: මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොටසේ, රේටියගම; ඉඩම පිළිබඳ විස්තර: උතුරට හා බස්නාහිරට ලියන්ගහ පෑලේ ඇලද, නැගෙනහිරට ගම්සභා පාර හා අඟුරුවැල්ල වත්තද, දකුණට බර්න්සයිඩ් තේ වත්තද යන මායිම් ඇතුලත පිහිටි, කුඹුම්රිස්කැටිය නම්වූ රජයේ ඉඩම; ඉඩමේ ඇති වගාව: එනසාල්; බිම් ප්‍රමාණය: අක්කර 50ක් පමණ.

7-1057—62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

එල්.බී/ඩබ්ලිව්. 682.

## මහනුවර දිස්ත්‍රික්කය, රේපියගම—කොරවුවකැලේ නම් වූ රජයේ ඉඩමේ එනසාල් වගාවේ පලදාව භුක්තිවිඳීමේ බද්ද වෙන්දේසියේ විකිණීමයි

මෙහි පහත දැක්වෙන උපලේඛනයෙහි සඳහන් රජයේ ඉඩමේ ඇති එනසාල් වගාවේ පලදාව අවුරුදු පහක කාලයකට භුක්ති විඳීමේ අයිතිය (මින් පසු දිසාපතිතුමා යයි කියැවෙන) මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපතිතුමන් විසින් තෙල්දෙනියේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලයේදී 1962 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 11.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ බදු දෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. දිසාපතිතුමා විසින් මෙම කාරණය සඳහා බලය පවරනු ලබන ඕනෑම නිලධාරි කෙනෙකුට දිසාපතිතුමා වෙනුවෙන් වෙන්දේසිය පැවැත්විය හැක.

3. වෙන්දේසියේදී ඉල්ලීම් ඉදිරිපත් කෙරෙන්නේ වාර්ෂික බදු මුදල පිට ය. වාර්ෂික බදු මුදල සඳහා මූලික වශයෙන් තබන ලංසුව වන රු. 150.00 ට අඩු කිසිම ඉල්ලීමක් පිළිගනු නොලැබේ.

4. සෑම ඉල්ලීමක්ම භාරගැනීමට පෙර, එම ඉල්ලීමේ සත්‍ය භාවය හා ඒ ඉල්ලුම්කරුට බද්දෙහි සඳහන් කරනු ලබන කොන්දේසි පිළිපැදීමට ඇති හැකියාවත් ගැන දිසාපතිතුමන් හෙවත් වෙන්දේසිය පවත්වන නිලධාරිතැන සොයා බලනු ඇත. යම් ඉල්ලීමක් එසේ පිළිගත හැකියයි දිසාපතිතුමා හෝ ඒ නිලධාරි තැන සෑහීමට පත් නොවුවහොත්, එම ඉල්ලීම ප්‍රතික්ෂෙපකර, එවැනි ඉල්ලීමක් නොකරනලද සේ සලකා බද්ද දිගටම වෙන්දේසි කරනු ඇත.

5. වෙන්දේසිය පවත්වන අවස්ථාවේදී, සෑම ඉල්ලුම්කරුවෙකුම තමන්ම හෝ ලියවිල්ලකින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකු මගින් හෝ ඉහතකී වේලාවේ එම ස්ථානයේ පැමිණ සිටිය යුතුය. නියෝජිතයෙකු මගින් ඉල්ලුම් කරන සෑම අවස්ථාවකදීම, ඉල්ලීම් ඉදිරිපත් කිරීම සඳහා මූලික ඉල්ලුම්කරු විසින් බලය පවරමින් දෙන ලද ලිපි එකී නියෝජිතයන් විසින් වෙන්දේසිය පටන්ගැනීමට පෙර පරීක්ෂාකර බැලීම සඳහා ඉදිරිපත් කළයුතුය.

6. ඉල්ලීම පිළිගනු ලැබූ ඉල්ලුම්කරු—

(ඒ) ඔහුගේ ඉල්ලීම භාරගත් වහා පළමුවන වර්ෂයේ බදු මුදල දිසාපතිතුමා හෙවත් වෙන්දේසිය පවත්වන නිලධාරිතැන වෙත ගෙවිය යුතුය.

(බී) බදු පොරොන්දු පත්‍රයක් ඉදිරිපත් කරනු ලැබූ 14 දිනක් ඇතුළතදී එයට අත්සන් තැබිය යුතුය.

යම් හෙයකින් ඔහු ඉහත සඳහන් (ඒ) හෝ (බී) යන්නෙන් දැක්වෙන කරුණු නොපිළිපැද්දොත් දිසාපතිතුමාට හෙවත් වෙන්දේසිය පවත්වන නිලධාරිතැනට එම වෙන්දේසිය අවලංගුකර එම ඉල්ලුම්කරු විසින් ගෙවන ලද යම් මුදලක් වෙතොත් එය රාජසන්තක කළ හැක.

7. පිළිගනු ලැබූ ඉල්ලීම ඉදිරිපත් කළ අය, දිසාපතිතුමා හෝ වෙන්දේසිය පවත්වන නිලධාරිතැන වුවමනා කළොත්, ඇප මුදලක් තැන්පත් කළයුතුය. එම ඇප මුදල මුළු බදුකාලයටම ඉල්ලුම් කරන ලද මුදලෙන් සියයට 10කට වැඩි නොවනු ඇත.

8. ඉල්ලුම් කරනලද මුළු මුදල ගෙවූ ඉක්බිති එම ඉල්ලුම්කරුට වෙනත් කොන්දේසි සමග පහත සඳහන් කොන්දේසිද ඇතුළත් බදු පොරොන්දු පත්‍රයක් ලබාගැනීමේ අයිතිය හිමිවේ:—

(ඒ) ඕනෑම අවස්ථාවක, මාසයක් කල් දෙමින් ලියවිල්ලක් බදුකරුට පුද්ගලිකව භාරදීමෙන් හෝ ඔහුගේ හෝ ඇයගේ අවසන්වරට දත් ලිපිනයට ලියාපදිංචිකළ තැපෑලෙන් යැවීමෙන් හෝ බද්දට අදාල ඉඩමේ පැහැදිලිව පෙනෙන ස්ථානයක අලවා තැබීමෙන් හෝ බද්ද අවලංගු කළ හැක.

(බී) බදු පොරොන්දු පත්‍රයෙන් ලැබෙන බල්ය බද්ද දරන්නාට පමණක් සීමාවේ.

(සී) බදුකරු බදු පොරොන්දු පත්‍රයෙහි ඒ සඳහා සඳහන්කර ඇති දිනයෙහිදී බදු මුදල ගෙවිය යුතුය.

(ඩී) බදුකරු බදු පොරොන්දු පත්‍රය මත ඔහුට ඇති හිමිකම්, අතුරු බද්දක් පිට දීම හෝ පැවරීම හෝ උගස්කිරීම හෝ වෙනත් මොනම ක්‍රමයකින් හෝ අන්සතු කිරීමක් නොකළ යුතුය.

(ඊ) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස බදුකරු ඉඩමේ ස්ථිර හෝ අර්ධ ස්ථිර ගොඩනැගිලි ඉදිකිරීම හෝ ස්ථිර වගාවක් ඇති කිරීම හෝ නොකළ යුතුය.

(එෆ්) දිසාපතිතුමාගේ කැමැත්ත පළමුවෙන් ලියවිල්ලකින් ලැබ මිස, බදුකරු ඉඩමේ වැවෙන ගස් කැපීම හෝ කැපීමට ඉඩ දීම, ඒවාට අලාභහානි කිරීම හෝ අලාභහානි කිරීමට ඉඩදීම නොකළ යුතුය.

(ජී) බදුකරු ඉඩමේ පස හෑරීම, වෙනත් ක්‍රමයකින් පස් ඉවත් කිරීම හෝ පස ඇවිස්සීම හෝ ඉඩම හෙළිකිරීම හෝ එනසාල් පඳුරු හොඳ තත්ත්වයේ තබාගැනීම සඳහා එනසාල් පඳුරු අවට හැර ඉඩම උදළුගෑම හෝ නොකළ යුතුය.

(එච්) ඉඩම වෙනුවෙන් ගෙවියයුතු බදු, අය බදු, වරිපනම්, ආදී සියළුම වැය මුදල් බදුකරු විසින්ම ගෙවිය යුතුය.

(අයි) බදු පොරොන්දු පත්‍රයේ සඳහන් මොනම කොන්දේසියක් හෝ කඩකිරීම දිසාපතිතුමාගේ නියමයන් පිට බදු පොරොන්දු පත්‍රය වහා අවලංගු කිරීමට හේතු වනු ඇත.

(ජේ) ඉඩමට කරනලද වැඩිදියුණු කිරීම්, ඉඩම වෙනුවෙන් කරන ලද මුදල් වැය කිරීම්, අලාභ හෝ වෙනත් මොනම කරුණක් නිසා හෝ වන්දි ඉල්ලීමකට බදුකරුට කිසිම අයිතියක් නොමැත.

(කේ) මෙම බද්ද ලැබීම, පසු කාලයකදී මෙම ඉඩමේ බද්ද හෝ අයිතිය අනුග්‍රාහී ලෙස ලැබීමට බදුකරුට ලැබෙන හිමිකමක් ලෙස සැලකිය යුතු නොවේ.

ඩී. කේ. ඇහැලේපොල,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති.
වෙනුවට.

1962 ජූලි මස 20 වැනි දින,
මහනුවර කච්චේරියේදීය.

### උපලේඛනය

ඉඩමේ පිහිටීම: මැදදුම්බර ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, රේපියගම; ඉඩම පිළිබඳ විස්තර: අංක 8,758 දරන මුල් සැලැස්මේ කට්ටි අංක 2, 3 හා 4 වශයෙන් දැක්වෙන, කොරවුව කැලේ නම්වූ රජයේ ඉඩම; ඉඩමේ ඇති වගාව: එනසාල්; බිම් ප්‍රමාණය: අ. 73, රූ. 0, ප. 18.

7-1062 — 62. 7. 27 දින අංක 13,230 දරන ගැසට් පත්‍රය

---

**සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් විමට ඉඩ තිබේ.**

**ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3. 30 ට ප්‍රථමයෙන්).**

**ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම ගෙවිය යුතුය.** <u>**ආණ්ඩුවේ** මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.</u>

---

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි